

# මෙතෙරින් එතෙරට

*ධර්ම දානය පිණිසයි !*

**"දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති"**

දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන්
පැන නැගී, අමා මහා නිවන නම් වූ මහා සාගරය
අවසන් කොට ඇති ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ
සිහිල් දිය දහරින් හෙබි උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන
ගංගාව (ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)
බොහෝ කල් ගලාබස්නා සේක්වා !

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

## ● බෞද්ධයා යනු කවරෙක් ද?

බෞද්ධයා කියන්නෙ **අවබෝධයෙන් ම තෙරුවන් සරණ ගිය කෙනාට** යි. මෙතැන දි අපට 'අවබෝධයෙන් තෙරුවන් සරණ ගියා කෙනා' කියල විශේෂයෙන් කියන්න සිදු වුනේ උපතින් බෞද්ධ වූ බොහෝ දෙනෙක් අවබෝධයෙන් ම තෙරුවන් සරණ යන ආකාරය නො දන්නා නිස යි. ඔබ ම ටිකක් හිතා බලන්න ඔබෙන් කවුරු හරි ඇහුවොත්, ඔබ තෙරුවන් සරණ ගියේ මොකට ද කියලා. මොකක්ද ඔබ දෙන පිළිතුර? සමහර විට පිළිතුරක් දෙන්න නො දන්නා නිසා ම ඔබ නිහඬ වේවි. ඒකෙන් පේන්නේ අද රටේ බොහෝ පිරිසක් නාමිකව තෙරුවන් සරණ ගියාට තේරුමක් නො දැනයි සරණ ගියේ.

සමහර විට තවත් කෙනෙක් කියන නිසා අපි තෙරුවන් සරණ යනවා. එහෙම නැතිනම්, දෙමව්පියන් තෙරුවන් සරණ යන නිසා අපිත් තෙරුවන් සරණ යනවා. සමහරු චාරිත්‍රයක් විදහටත් තෙරුවන් සරණ යනවා. එහෙම කළා මිසක් අපි තෙරුවන් සරණ යාමෙන් හැබෑවට ම බලාපොරොත්තු විය යුත්තේ මොකක් ද කියන එක පිළිබඳවත් ඒ බලාපොරොත්තුව ඇත්තට ම හරියන එකක් ද කියන කාරණය ගැනත් චුට්ටක්වත් හිතලා බැලුවේ නෑ නේද? නිවැරදිව තෙරුවන් සරණ නො ගිය නිසා ම අපේ බෞද්ධයන් අද ඉතාම අසරණ පිරිසක් බවට පත් වෙලා.

## ● හොඳයි එහෙම නම්, නිවැරදිව තෙරුවන් සරණ යන්නේ කොහොම ද?

අපි කවුරුත් තෙරුවන් සරණ යන්නේ, **"බුද්ධං සරණං ගච්ඡාමි"** ආදී වශයෙන් තුන් වරක් කීමෙන් බව ඔබ දැනටමත්

දන්නවා. බලන්න මෙතනදි අපි කියනව, "මම බුදුරජාණන් වහන්සේ සරණ යමි. ධර්ම රත්නය සරණ යමි. සංඝරත්නය සරණ යමි" කියල. **ඇයි අපි තවත් කෙනෙක්ව සරණ යන්නෙ?** ඇත්තට ම අපිට වෙනත් කෙනෙකුගේ සරණ උවමනා වෙන්නෙ අපි "අසරණ" වුනා ම යි. මොහොතක් හිතලා බලන්න, ඔබ ලෙඩ වෙලා අසරණ වුනා ම වෛද්‍යවරයෙකු ගේ සරණ සෙව්වේ නැද්ද? ඒ වගේ ම මුදල් හදල් හිඟ වුනා ම මුදල් තියෙන කෙනෙකුගෙන් පිළිසරණක් සෙව්වෙ නැද්ද?

**මේ ජීවිතය තුළ කිසිම ආකාරයක අසරණ කමක් නැතිනම් අපිට වෙනත් කෙනෙක් සරණ යන්න වුවමනාවක් ඇතිවෙන්නේ නෑ.** බොහෝ දෙනෙක් හිතුවේ නැති වුනාට අන්න ඒ වගේ ලොකු අසරණ කමක් අපි හැමදෙනාගෙ ම ජීවිත තුළ සැඟවිලා තියෙනවා. අපේ ජීවිත තුළ ඒ විදිහට මුල් බැසගත්තු අසරණ කමෙන් නිදහස් වෙන්න යි, අපි තෙරුවන් සරණ යන්නේ. එහෙමනම්, අවබෝධයෙන් ම තෙරුවන් සරණ යන කෙනා තුළ ඒ අසරණ කමින් නිදහස් වෙනවා කියන උවමනාව තියෙන්න ඕනෙ. ඒ වුවමනාව නැතිව කොපමණ වාරයක් වේවා **"තෙරුවන් සරණ යමි"** කියල වචනයෙන් කිව්වට එයා නියම බෞද්ධයෙක් වෙන්නෙ නෑ.

## ● අනේ, ඇත්තට ම, මොකක් ද ඒ අසරණකම?

සමහර විට ඔබට ඕනෑ තරම් මුදල් හදල් ඇති. හොඳ ගෙයක් දොරක් ඇති. යාන වාහන යාළු මිත්‍රයන් ඕනෙ තරම් ඇති. සමාජයේ හොඳට කීර්ති ප්‍රශංසා ලැබෙනවත් ඇති. එහෙමනම්, ඔබ අසරණ කෙනෙක් ද? හැබෑවට ම ඔය මොනවා තිබුණත් ඔබ අසරණයි. මෙහෙම කීවා ම සමහර විට ඔබට පුදුම හිතෙනවත් ඇති. "සැප සම්පත් ඔක්කොම තියෙනවා නම් එතන මොන අසරණ කමක් ද?" කියලා

දැන් මොහොතක් හිතන්න. සමහර විට ඔබ දැන් වයස අවුරුදු 15-20 ක් විතර වෙන තරුණයෙක් වෙන්න ඇති. එහෙම නැත්නම් මැදිවියේ හෝ මහළු වයසේ ඉන්න කෙනෙක්. ඇත්තට ම ඔබ ඔය වයසේ ම හැමදාම ඉන්නව ද? තව තවත් වයසට

යනවා ද? මෙහෙම අහද්දී සමහර විට ඔබට ඔබේ ළමා කාලය මතක් වේවි. ළමා කාලෙ කාටත් හොරා ම ගෙවිලා ගියා. ළමා කාලේ පසු කරලා, ඔබ දැන් ඔය ටික ටික පරිණත වෙන්නේ වයස ටිකෙන් ටික ගෙවිලා යන නිසා ම යි. තරුණ වයසෙ ඉන්න කෙනා වයසට යන්න කොහෙත් ම කැමති නෑ. ඇත්තට ම වයසට යනවට කවුද කැමති? ඒත් ඔබ අකමැති වුනා කියලා ඒ වයසට යාම ඔබට නවත්වන්න පුළුවන් ද? බැහැ නේද? ඔන්න ඔබ අසරණ වෙන තැනක්.

ඊළඟට ඔබේ ජීවිතේ ගැන ම මොහොතක් හිතලා බලන්න. ඔබ ලෙඩ දුක් වලට මුහුණ දෙනවා නේද? සනීප කරන්න බැරි සමහර අසනීප හැදෙන්න පුළුවන්නෙ. මේ ලෝකේ ලෙඩ වෙන අය ලෙඩ වෙන්නේ කලින් දැනුම් දීමක් කරලා නොවෙයි. පිළිකා වගේ භයානක රෝග ඔබ කරා නො එයි කියලා ස්ථිරව ම කියන්නේ කොහොම ද? අන්න ඒක තමයි අසරණ වෙන අනෙක් කරුණ.

වසර දහස් ගණනින් කාලය ගෙවිලා ගියා. මේ ලෝකේ මහා උගත්තු, මහා ධනවත්තු, මහා රජවරු පහළ වුනා. රූපයෙන් බොහෝම ලස්සන අය ඉපදිලා හිටියා. සමහර විට ඔබ ඒ අය ගැන අදටත් කතා වෙනවා ඇති. නමුත් අතීතයේ හිටිය ඒ එක්කෙනෙකුට වත් නො මැරී ඉන්න පුළුවන් වුනා ද? කොයිතරම් දේ හිමි කරගෙන හිටියත්, මරණයේ දී ඒ සියල්ල ම ඒ උදවියට අහිමි වුනානේ. ඔය මිල මුදල්, ගේ දොර, යාන වාහන ඔක්කොම අතහැරලා යම් දවසක ඔබටත් මරණයට පත් වෙන්න සිදු වෙනවා නේද? මේ ගැන නම් සිහිකරන කොටත් ඔබ බය වෙනවා ඇති. නමුත්, අපි කාටත් මැරෙන්න සිදුවෙනවා. ඕක තමයි අනික් අසරණකම. ටිකක් හිතලා බලන්න මේ වයසට යාමත්, ලෙඩ වීමත්, මරණයත් හමුවේ ඔබ අසරණ නැති ද කියලා. මේවායින් ගැලවෙන්න ඔබට පිළිතුරක් තියෙනවා නම් කියන්න.

- **එහෙම නම්, තෙරුවන් සරණ ගියාම වයසට යන්නෙ නැති ද? ලෙඩ වෙන්නෙ නැති ද? මැරෙන්නෙ නැති ද?**

එහෙම නෙවෙයි, ඔබ ඔය ප්‍රශ්නෙ අහපු විදිහ වැරදි යි. ඔබ ඒ ගැන තවත් දෙයක් හිතන්න ඕනෙ. තෙරුවන් සරණ ගිය අයත් වයසට යනවා, අනික් අයත් වයසට යනවා. තෙරුවන් සරණ ගිය අයත් ලෙඩ වෙනවා, අනිත් අයත් ලෙඩ වෙනවා. තෙරුවන් සරණ ගිය අයත් මැරෙනවා, අනිත් අයත් මැරෙනවා. හැබැයි මේ කාරණා ඔහොම සිද්ධ වෙද්දී නිවැරදිව තෙරුවන් සරණ ගිය අයගෙයි අනිත් අයගෙයි වෙනසකුත් තියෙනවා.

ඒ වෙනස තමා තෙරුවන් සරණ ගිය කෙනා වයසට ගියාට අසරණ නෑ. ලෙඩ වුනාට අසරණ නෑ. මරණයට පත් වුනාට අසරණ නෑ. අනිත් කෙනා ලෙඩවෙන්නෙ, වයසට යන්නෙ, මරණයට පත්වෙන්නෙ අසරණයෙක් විදිහට ම යි. ඒ කියන්නේ නිවැරදිව තෙරුවන් සරණ නො ගිය කෙනා වයසට යනකොට බොහොම දුක් වෙනවා. අඬනවා. වැලපෙනවා. දැනට වුනත් ඔබේ හිස කෙස් ටික ටික සුදු වෙවී යද්දී ඇතිවෙන්නේ සතුටක් නෙමෙයිනේ. එහෙම එකේ ඒ කෙනා වයසට යද්දී, තව තව කායික වශයෙන් දුර්වල වෙද්දී, දුකින් තමා කාලය ගත කරන්නෙ. ඒ වගේ ම, ඒ කෙනා ලෙඩ වෙනකොටත් දුක් වෙනවා. අඬනවා, වැළපෙනවා, නිතර ම කාලය ගත කරන්නේ දුකින්. මරණය ගැන නම් කියන්න ම දෙයක් නෑ. සති ගණන් මාස ගණන් දුක් වෙනවා මරණයක් ගැන සිත සිත. නමුත් නිවැරදිව අවබෝධයෙකින් යුතුව ම තෙරුවන් සරණ ගිය කෙනා, ඒ විදියට දුක් වෙන්නෙ වැලපෙන්නෙ නෑ. ඒ වගේ ම නිවැරදි ව තෙරුවන් සරණ ගිය කෙනා ට ඔය වයසට යාමෙන්, ලෙඩ වීමෙන්, මරණයෙන් ගැලවෙන්න පුළුවන්.

## ● තෙරුවන් සරණ ගිහින් මරණයෙන් ගැලවෙන්නේ කොහොම ද?

ඒක හොඳ ප්‍රශ්නයක්. තෙරුවන් සරණ ගිය කෙනාට මරණයෙන් ගැලවෙන්න පුළුවන්. හැබැයි තෙරුවන් සරණ ගිය පමණින් ම නෙවේ. තවත් දේවල් කරන්න තියෙනවා. දැන් මෙහෙම හිතන්න. ඔබ මරණයට පත්වෙන්නෙ ඇයි? ඉපදුනු නිසා නේද? ඉතින් ඉපදෙන්නෙ නැතිව හිටියොත්, ආයෙ මරණයට පත්වීමක් නෑනේ. ඒ නිසා ඉපදීම නැති කළොත් මරණයට පත් වීම නැති

කරන්න පුළුවන්. ඒ වගේ ම වයසට යාම ලෙඩ වීම නැති කරන්නත් පුළුවන්.

නිවැරදිව තෙරුවන් සරණ ගිය කෙනා ඔය කියන **ඉපදීම** නැති කරන්න මහන්සි වෙනවා. ඒ විදිහට තමන්ගේ ජීවිතය පවත්වන්න මහන්සි ගන්නවා. එයා බලන්නෙ කොහොම හරි මේ **ඉපදීම** නැතිකර දමන්න යි. ඒ නිසා ලෙඩ වුනාට වයසට ගියාට එයා අමුතුවෙන් දුක් වෙන්නෙ නෑ. එයා දන්නවා මේවා ඉපදුනු කෙනාට උරුම වූ දේවල් බව. ඒ නිසා ඒ ලෙඩ වීම, වයසට යාම කියන දේවල් තේරුම් ගන්නට යි එයා මහන්සි වෙන්නේ. මොකද, අපි ඒ ගැන කොච්චර දුක් වුනත්, පසු තැවිලි වුනත් ඒ නිසා ඕවයින් නිදහස් වෙන්න බැහැනේ. ඇත්තට ම ඔබට ආයෙ ඉපදීම ගැන බයක් නැති ද?

## ● අනේ... මට නම් ආයෙ ඉපදෙන්න බයක් නැහැ.

ඒක හරි පුදුමයි. මම නම් ඉපදෙන්න හරි බය යි. එහෙම නම් මට කියන්න ඔබ දැකල තියෙනව ද, මනුෂ්‍යයන් අතර එක ඇහැක් හරි ඇස් දෙක ම හරි නො පෙනෙන අය? එහෙම නැතිනම් අත පය නැතිව දුක් වෙන අය. කථා කරන්න බැරිව දුක්වෙන අය. කන් නො ඇසී දුක් වෙන අය. කියන දේ තේරුම් ගන්න බැරිව දුක් විඳින අය. පාරෙ තොටේ යද්දී සමහර අය දැක්කම හිතේ ඇති වෙන්නේ ලොකු කම්පනයක්. සමහර වෙලාවට "මෙච්චර විරූපී අය ලෝකෙ ඉන්නව ද?" කියල පුදුමත් හිතෙනවා. මේ මනුෂ්‍යයන් අතර ඔය වගේ අය ඔබ කොච්චරවත් දැකලා ඇති නේද? හොඳයි, ඔබට නැවත ඉපදෙන කොට ඔය විදිහෙ දුබල කමක් ඇතිව ඉපදුනොත් ඒ ගැන බයක් නැති ද? එහෙම වෙන්නේ නෑ කියලා ඔබට ස්ථිරව ම කියන්න පුළුවන් කමක් තියෙනවා ද? අන්න බලන්න, ඔබ නිශ්ශබ්ද යි. ඒ ප්‍රශ්න වලට ඔබට පිළිතුරු නෑ.

එහෙම නම් හිතන්න එපා මේ ජීවිතයේ හොඳට ඇස් පෙනුනාට, කන් ඇහුනාට, අත පය තිබුනාට ආයෙ ආයෙමත් මේ විදිහට ම උපදින්න ලැබෙයි කියලා. ඔය වගේ අංගසම්පූර්ණ සිරුරක් ඉපදෙන හැම කෙනාට ම ලැබෙන්නේ නෑ. අපි උපදින

විදිහ තීරණය වෙන්නේ කරන කුසල අකුසල කර්ම වල විපාක වලට අනුව යි. මේ අනුව බලද්දී, ආයෙමත් ඉපදෙනවා කියන එක හරි භයානක දෙයක්. ඊළඟ ජීවිතයේ දී අපි කොයි විදිහේ කෙනෙක් වෙලා ඉපදෙයි ද කියලා කාට ද කියන්න පුළුවන්. දැන් මම ඔය කීවේ මේ මනුෂ්‍ය ලෝකෙ ගැන විතර යි. බැරිවෙලාවත් අපි තිරිසන් ලෝකේ ඉපදුනොත්....

## ● මිනිස්සු මැරුණාම තිරිසන් ලෝකේ උපදිනවා ද?

අන්න බලන්න, ඔබ හිතාගෙන හිටියෙ ආයෙමත් මනුස්ස ලෝකේම සැප සම්පත් ඇතිව ඉපදෙන්න නේද? ඒක ඒ විදිහට වෙන්න තියෙන ඉඩකඩ ගොඩක් ම සීමා සහිත යි. තිරිසන් ලෝකෙ විතරක් නෙවෙයි, අපි මැරිලා ගියාම උපදින්න පුළුවන් ලෝක කීපයක් ම තියෙනවා. ඒවා තමයි ප්‍රේත ලෝකය, තිරිසන් ලෝකය, නිරය, මිනිස් ලෝකය හා දිව්‍ය ලෝකෙ කියලා කියන්නේ. මැරුණාම අපි කැමති වුනත් නැතත් කර්මයට අනුව මේ ලෝක වලින් එකක උපදින්න සිද්ධ වෙනවා. හැබැයි මනුෂ්‍ය ලෝකේ දිව්‍ය ලෝකේ ඉපදෙනවා කියන එක සිදුවෙන්නේ කලාතුරකින්. වැඩි පිරිසක් උපදින්නෙ තිරිසන්නු වෙලා, පෙරේතයො වෙලා, නිරයේ නිරිසත්තු වෙලා. ඒකට හේතුව අපි කරන කුසල් අකුසල්.

ස්වභාවයෙන් ම අපේ සිත බර කුසලයට නෙවෙයි. අකුසලයට යි. දැන් බලන්න අපි මැරිලා තිරිසනෙක් හරි ප්‍රේතයෙක් හරි නිරිසතෙක් හරි වුනොත් අපිට කොයි තරම් දුක් විඳින්න සිදු වෙනවාද? හරියට කෑමක් නෑ. බඩගින්නෙ පිපාසයෙන් ඉන්න වෙනවා. හැම තිස්සේම ඉන්න වෙන්නෙ බයෙන් තැති ගැනීමෙන්. අනන්ත දුක් විඳින්න වෙනවා. හැබැයි අපිට මතක නැති වුනාට, අපි මෙච්චර කල් ආවේ ඔය වගේ නිරයේ, තිරිසන් ලෝකයේ, ප්‍රේත ලෝකයේ ඉපදි ඉපදී තමයි. ඔබ අහලා ඇති නේ ඔය සමහර අය මැරිලා ප්‍රේතයෝ වෙලා ඉපදෙන බව.

## ● එතකොට අපි මීට පෙරත් ඉපදිලා ඉඳලා තියෙනවා ද?

ඇයි නැත්තේ. ඔබ හිතුවේ ඔබ මේ මනුෂ්‍ය ලෝකයේ

ඉපදුනේ අළුතෙන් ම කියල ද? නැහැ. අපි මේ ඉපදි ඉපදී මැරි මැරී යන දීර්ඝ ගමනක් යන්නේ. ඒකට කියන්නේ **සංසාර ගමන** කියල. ඒක හරිම භයානකයි. මේ සංසාර ගමන පටන් ගත්ත තැනක් කියන්න අමාරුයි. එච්චර දිග සංසාර ගමනක අපි ඉපදෙමින් මැරෙමින් ඇවිත් තියෙනවා.

ඔය සංසාර ගමනේ දී මේ මනුෂ්‍ය ලෝකෙ ඉපදෙනවා කියන එක ඉතා ම දුර්ලභ කාරණයක්. ඒකට බුදුරජාණන් වහන්සේ උපමාවක් කියා දුන්නා. ඔන්න එක සිදුරක් තියෙන විය දණ්ඩක් මුහුදට දානවා. ඉතින් මේ විය දණ්ඩ මුහුදේ පාවෙමින් තියෙන කොට, අවුරුදු සීයකට එක් වතාවක් උඩට එන එක ඇහැක් විතරක් පේන කැස්බෑවෙක් අර විය සිදුරෙන් අහස බලනවාටත් වඩා, මිනිස් ජීවිතය ලබන එක දුෂ්කරයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. එතකොට මේ ලැබිල තියෙන මනුෂ්‍ය ජීවිතය කොයි තරම් වටිනා එකක් ද කියලා ටිකක් හිතලා බලන්න.

ඒ වගේ ම, බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනව, මේ මිනිස් ලෝකෙ අපිත් එක්ක ඉඳලා මැරෙණ අයගෙන් ඉතා ම ටික දෙන යි ආයෙමත් මනුෂ්‍ය ලෝකෙම ඉපදෙන්නෙ කියල. ඒක හරියට මහ පොලොවෙන් නියපොත්තට ගත්ත පස් ටිකක් වගේ, ඉතාම ටිකයි. මිනිස් ලෝකෙ ඉඳලා මැරෙන මිනිස්සු අතරින් මහ පොළොවේ පස් වගේ අතිවිශාල ප්‍රමාණයක් ඉපදෙන්නෙ නිරයේ, ප්‍රේත ලෝකයේ හා තිරිසන් ලෝකයේ කියලා බුදු සමිඳුන් වදාළා. ඒකට හේතුව තමයි, අකුසල් සිදු කරන පිරිස වැඩියි. ඉතින් බලන්න, මනුෂ්‍යයෙක් වෙලා ඉපදෙන එක කොයිතරම් වාසනාවක් ද? අඩුපාඩුවක් නැති මනුෂ්‍ය ජීවිතය ඊටත් වඩා වාසනාවක් නේද?

## • නිරය කියලා එකක් ඇත්තට ම තියෙනවා ද?

ඇත්තමට නිරය කියලා එකක් තියෙනවා. අකුසල් කළොත් අපටත් ඒ නිරයේ ඉපදෙන්න සිදු වෙනවා. අපි මීට පෙර ජීවිත වල ඔය නිරයේ ඉපදිලා ඉඳලත් තියෙනවා. නිරයේ විස්තර පිළිබඳව බුදුරජාණන් වහන්සේ **"දේවදූත"** කියන සූත්‍ර දේශනයේ දී ඉතාම ලස්සනට පැහැදිලි කරල දුන්නා. මේ මනුෂ්‍ය ජීවිතයේ

දී කෙනෙක් පස් පව්, දස අකුසල් කළා ම ඒවායේ විපාක විදිහට නිරයේ ඉපදෙන්න සිදු වෙනවා. ඔය විදිහට අකුසල් කළ කෙනෙක් මරණයට පත්වුනා ම බොහෝ විට නිරයේ උපතක් කරා යනවා. ඒ උදවිය ඕපපාතිකව නිරයේ ඉපදෙනවා. එතකොට යමපල්ලන් එයාව අරගෙන ගිහින් බිම නිදි කරවලා රත් වෙච්ච යකඩ උල් දෙකකින් අත් දෙකට අනිනවා. ඒ වගේ ම තවත් රත්වුණු යකඩ උල් දෙකකින් පා දෙකටත් අනිනවා. තවත් රත් වෙච්ච යකඩ උලකින් පපුවට අනිනවා. ඒ නිරිසතා අකුසල් ගෙවෙන තාක් දුක් විඳිනවා.

ඒ වගේම, එයාව බිම නිදි කරවලා වෑයෙන් ශරීරය රැහැලා දානවා. ගිනි ඇවිලෙන බිම ඇවිද්දවනවා. රත්වෙච්ච ගිනි අඟුරු කඳු වලට නග්ගවනවා. කකුල් දෙකෙන් අල්ලලා ලෝ දිය හැලියට දානවා. ඒවට කර්මානුරූපව හැදිච්ච ලොකු ලෝදිය හැලි තියෙනවා. මේ අරසණ නිරිසත්වයා ඒ පැහෙන ගිනියම් වූ ලෝදිය හැලිය ඇතුලෙ පෙණ පිඬක් වගේ උඩටත් පල්ලෙහාටත් යමින් කැකෑරෙමින් දුක් විඳිනවා. නමුත් කර්මය ගෙවිලා ඉවර වෙනකම් මැරෙන්නෙ නෑ. බඩගිනියි කීවා ම රත් වෙච්ච යකඩ අඬුවකින් කට ඇරලා රත් වෙච්ච ගිනි ගුලි කවනවා. ඒ ගිනි ගුලි මුලු උදර ප්‍රදේශය ම පුච්චගෙන පිටුපසින් බිමට වැටෙනවා. පිපාසයි කීවා ම උණු ලෝදිය පොවනවා. මේවා තමයි එයාට ලැබෙන කෑම බීම.

ඊළඟට එයා මහා නිරයට ඇදලා දානවා. ඒක හැම පැත්තෙන් ම ගිනි ඇවිලෙන තහඩු වලින් වට වෙච්ච කාමරයක්. ගින්නෙන් බේරෙන්න එහාට මෙහාට දුවනවා. ගින්නෙන් බේරෙන්න දුවද්දී ඇට ඇටමිඳුළු දක්වා ම පිච්චිලා යනවා. කරපු අකුසලය ඉවර වෙන කල් ම ඒ නිරිසතා මැරෙන්නේ නෑ. අනන්ත දුක් විඳිනවා. ඔන්න ඔය වගේ දුක් තමයි නිරයේ ඉපදුනු කෙනාට විඳින්න සිදුවෙන්නේ. නිරය ගැන බුදුරජාණන් වහන්සේ කියාදෙන්නෙ ඔය දේවදූත සූත්‍රයේ දී විතරක් නෙවෙයි. තවත් ගොඩක් සූත්‍ර දේශනා වල දී නිරය ගැන කියලා දෙනවා.

## ● එතකොට පෙරේතයො වෙලා ඉපදෙන්නේ ඇයි?

ඒකටත් හේතුව පව් කිරීම ම යි. සමහර පාප කර්ම නිසා නිරයේ උපදිනවා. සමහර පාප කර්ම නිසා පෙරේතයෝ වෙලා උපදිනවා. පෙරේත ලෝකෙත් ඉතාම දුක් සහිත යි. අපිට වගේ කෑම බීම නෑ. කෙළ, සොටු, සැරව, අසූචි වගේ අපිරිසිදු දේවල් තමයි එයාලගෙ කෑම. ඒවා වුනත් හොයාගන්න බොහෝම දුක් විඳිනවා. පෙරේතයෝ ගැන ගොඩක් විස්තර තියෙනවා **ප්‍රේත වත්ථු** කියන පොතේ.

දවසක් මුගලන් මහරහතන් වහන්සේ දැක්කා ඇටසැකිල්ලක් වගේ ප්‍රේතයෙක්. කපුටො එයාගේ ඇට සිදුරු කරලා ඇට මිදුළු කනවා. ඒ ප්‍රේතයා වේදනාවෙන් කෑ ගහනවා. ඔන්න ඔය වගේ තමයි ප්‍රේත ලෝකයේ හැටි. ඒ ඊට පෙර ජීවිතයක දී හරකුන් මරලා මස් කරලා විකුණපු කෙනෙක්. ඒ පාපයේ විපාක විදිහට බොහෝ කාලයක් නිරයෙ ඉඳලා දැන් ඔය වගේ ප්‍රේතයෙක් වෙලා ඉපදිලා දුක් විඳිනවා.

තවත් දවසක මුගලන් මහරහතන් වහන්සේ දැක්කා සම නැති ස්ත්‍රී ප්‍රේතියක්. එයාගේ ඇඟේ මස් කුරුල්ලො කොට කොටා කනවා. ඒ ප්‍රේතිය වේදනාව ඉවසගන්න බැරිව විලාප දෙනවා. ඒ ඊට පෙර ජීවිතයක දී පරපුරුෂ සේවනයේ යෙදුණ කාන්තාවක්. ඔන්න ඔය වගේ තමයි ප්‍රේත ලෝකයේ දුක් වල ස්වභාවය. ප්‍රේත ලෝකයේ ඉපදුනු අයට ලැබෙන්නේ ඉතාමත් විරූපී ශරීරයි. මේ අයට තියෙන්නෙ ඉතාමත් සියුම් ශරීර නිසා හැමෝට ම ප්‍රේතයන්ව පේන්නෙ නැහැ. මේ ලෝකේ කොච්චර හොඳට කාලා බීලා, ලස්සන ම ශරීරයක් ලබලා හිටියත් ප්‍රේත ලෝකයේ ඉපදෙන්න සිද්ධ වුනොත්, ඔය වගේ දුක් තමයි විඳින්න තියෙන්නේ.

## • එහෙමනම් කොහොමහරි දිව්‍ය ලෝකෙකට පැනගත්තොත් නම් හරි...

ඔන්න, ඔබ ඔහොම හිතන්නේ මේ සංසාරෙ ස්වභාවය දන්නෙ නැති නිස යි. දිව්‍ය ලෝක කියල කියන්නෙ ඉතාමත් ඉහළ සැප තියෙන ලෝක තමයි. ඒත් ඒ දිව්‍ය ලෝකවලට ත් ආයුෂක් තියෙනවා. හැබැයි අපේ මනුෂ්‍ය ලෝකෙ වගේ නෙවෙයි, දිව්‍ය ලෝකෙ ආයුෂ ටිකක් දිග යි. කොච්චර ඉහළ සැප සම්පත්

තිබුණත් ආයුෂ ඉවර වුනහම ඒවා ඉවරයි නෙ.

කරපු පින්වල විපාක ඉවර වුනාට පස්සේ ඒ දෙව් ලොවෙන් සමුගෙන යන්න සිද්ධ වෙනවා. බුදු සමිඳුන් වදාළා චාතුම්මහාරාජික, තව්තිසාව, යාමය, තුසිතය ආදී දිව්‍ය ලෝක ගණනාවක් ගැන. හැබැයි ඒ හැම එකක ම ආයුෂ ගෙවිලා යනවා. දෙවිවරුත් ටික ටික වයසට යනවා. අන්තිම ට දෙව් ලොවෙන් චුත වෙලා නැවතත් කරලා තියෙන පින් පව් වලට අනුව උපතක් කරා යනවා. නැවත නැවතත් සතර අපායේ උපතක් කරා යන්නට තමයි බොහෝමත් ම ඉඩකඩ තියෙන්නේ. ඒ නිසා, ඔබ හිතපු විදිහට දිව්‍ය ලෝකයෙ ඉපදුනු පළියට මේ ප්‍රශ්නයෙන් ගැලවෙන්න ලැබෙන්නෙ නම් නැහැ.

## • ඉතින් ඕකට තෙරුවන් සරණ යන්න ම ඕනෙද? පින් කර කර ම හිටියා ම හරිනෙ...

අන්න... ඔබට ආයෙමත් සැරයක් වැරදුනා. මේ සංසාරයේ අපි ගමන් කරන්නේ පින් පව් වල විපාක වලට අනුව තමයි. එතකොට පින් කළා ම ඒවායෙ ප්‍රතිඵල විදිහට සැප විපාක ලැබීම සිදුවෙනවා. ඔබ මේ ජීවිතයේ දී කිසිම පවක් නො කර, පින් කර කර ම හිටියා කියල හිතමු. ඒ පින් වල විපාක සංසාරේ කවදා හෝ ඔබට ලැබෙනවා. ඒත් මොහොතක් හිතල බලන්න. මේ සංසාරයේ අපි මේ ඉපදුනේ පළමුවෙනි වතාවට නොවෙයි. මුළින් ම කීවනෙ, හිතන්නත් බැරි තරම් දීර්ඝ කාලයක් අපි ඉපදෙමින් මැරෙමින් මේ සංසාරේ ආපු බව.

ඉතින්, ඒ පෙර ජීවිත වල දී ඔබ කරපු කුසල් අකුසල් ගැන, ඔබ දන්නව ද? අන්න බලන්න, ඔබට ඒ කරපු කුසල් අකුසල් ගැන විතරක් නොවෙයි ගත කරපු පෙර ජීවිත ගැනවත් මතකයක් නැහැ නෙ. එහෙම එකේ, ඔබ මේ ජීවිතයේ කොච්චර හොඳට හිටියත්, පෙර ජීවිතයක දී කරපු පාප කර්මයක් මතුවෙලා ආවොත් ඔබට නැවත වතාවක් සතර අපාය ට උපතක් කරා යන්න ඉඩ තියෙනවා නේ ද?

අනික පින කියල කියන්නේ අපට බොහෝ උපකාර වෙන

සැප ලබාදෙන හොඳ දෙයක් තමයි. ඒත්, ඔබ දැන් දන්නවනෙ පින කියල කියන්නෙත් ගෙවිල ඉවර වෙන දෙයක් කියල. ඒ නිසා දැන් ඔබට තේරෙනව නේද, **පින් කර කර ගිය පමණින් ම මේ ප්‍රශ්නයට පිළිතුරක් නො ලැබෙන බව.**

## ● එහෙම නම්, ඕවායින් ගැලවෙන්න මොකද කරන්න ඕනෙ?

අන්න දැන් තමයි, වැදගත් ම ප්‍රශ්නය ඇහුවෙ. ඕවායින් ගැලවෙන්න ක්‍රමයක් තියෙනවා. **ඒකට නිවැරදිව තෙරුවන් සරණ ගිහිල්ලා ධර්මානුකූලව කටයුතු කරන්න ඕනෙ.** අපේ රටේ බෞද්ධයෝ නිවැරදිව තෙරුවන් සරණ ගියෙ නැති නිසා, **'තෙරුවන් සරණ ගිය කෙනා කළ යුත්තේ කුමක් ද?'** කියලා හරියට ම දැන ගෙන හිටියෙ නැති නිසා, ඒ අයට කරන්න දෙයක් තිබුනෙ නැහැ. වෙන කෙනෙක් කියන කොට **"බුද්ධං සරණං ගච්ඡාමි"** කියලා නිකං හිටියා.

නියම බෞද්ධයා එහෙම නොවෙයි. **එයා තෙරුවන් සරණ ගියේ තමන්ගේ අසරණකමකට පිහිටක් බලාපොරොත්තුවෙන්.** අපි මුලින් ම කීවනෙ, ඒ අසරණකම තමා වයසට යෑම, ලෙඩ වීම, මරණයට පත් වීම. මේ ඔක්කොම සිදුවෙන්නේ ඉපදුනු නිසා නෙ. ඒ නිසා ඉපදීම නැති කළොත්, මනුෂ්‍ය ලෝකෙ දුක් විඳින්න වෙන්නෙත් නැහැ. ප්‍රේත ලෝකෙ, නිරයෙ, තිරිසන් ලෝකෙ දුක් විඳින්න වෙන්නෙත් නැහැ. දැන් අපි දන්නවා නෙ, දිව්‍ය ලෝකෙ ඉපදුනත්, ඒ පින ඉවර වෙන කොට ආයෙමත් සතර අපායට යන්න සිදුවෙන බව. ඒ නිසා, මේ නැවත නැවතත් ඉපදෙන එකෙන් නිදහස් වෙන්න පුළුවන් වුනොත්, ජීවිතයට ලොකු දෙයක් කරගත්තා වෙනවා.

## ● ඉපදීම නැති කරන්න පුළුවන් ද?

ඇත්තට ම ඉපදීම නැති කරන්න පුළුවන්. අපි ආයෙ ආයෙමත් ඉපදෙන්නෙ තණ්හාව (ආශාව) නිසා. ඒ ආශාව නැති කිරීමෙන් ඉපදෙන එක නැති කරන්න පුළුවන්. හැබැයි, **තණ්හාව නැති කරන එක පිළිවෙලින් කළ යුතු දෙයක්.** අපි තණ්හාව නැති

කරන්න කැමති වුනා කියලා තණ්හාව නැති වෙන්නෙ නැහැ. ඒකට වැඩ පිළිවෙලක් තියෙනවා. ඒ වැඩපිළිවෙල බුදුරජාණන් වහන්සේ ඉතාම හොඳට අපට පැහැදිලි කරලා දීලා තියෙනවා. ඒක හොඳට තේරුම් අරගෙන ඒ අනුව කටයුතු කිරීම තමයි කරන්න ඕනෙ.

ඒ වැඩ පිළිවෙලේ මුළින් ම කරන්න ඕනෙ දෙයක් තමයි **සිල්වත් වෙන එක.** එතකොට ඔබට හිතෙයි සිල් පද කීයක් ආරක්ෂා කරන්න ඕනෙ ද කියල. ඒකට ඔබ සමාදන් වෙලා ඉන්න පංච ශීලය හොඳට ම ඇති. ඔබ සමාදන් වෙලා තියෙන පංච ශීලය හොඳට ආරක්ෂා කරන්න. බුදුරජාණන් වහන්සේ වදාළ දේ විශ්වාස කරගෙන හොඳට පංච ශීලය ආරක්ෂා කරන කෙනෙක් නම්, ඔබ ඉපදීම නැති කරන වැඩ පිළිවෙලට ඇතුළත් වූ කෙනෙක්. අඩුම තරමේ මේ ජීවිතයේ දී ම සතර අපායේ උපදින එකෙන් වත්, නිදහස් වෙන්න මහන්සි ගන්න ඕනෙ.

## ● සතර අපායෙ උපදින එකෙන් නිදහස් වෙන්නෙ කොහොම ද?

හොඳයි... ඔබ දැන් දන්නවා අපි සතර අපායෙ උපදින්නේ ඇයි කියලා. සතර අපායේ ඉපදෙන ස්වභාවයෙන් යුතු කර්ම රැස් වුනා ම තමයි, ඒවායේ විපාක විදිහට සතර අපායේ උපතක් කරා යන්නෙ. මොහොතක් හිතලා බලන්න, **මේ තාක් ම ඔබට සතර අපායේ යන ස්වභාවයෙන් යුතු කර්ම යම් යම් ආකාරයෙන් රැස් වුනා නම්, ඒ සියලු කර්ම නැති කරලා දැම්මොත්, ආයෙත් ඒ වගේ කර්ම කරන්නෙත් නැතිනම්, ඔබ සතර අපායේ යන ස්වභාවයෙන් අත්මිදෙනවා.** අන්න ඒ දේ කරන ක්‍රමය අපට කියලා දෙන්නේ ඉතාමත් කලාතුරකින් මේ ලෝකයට පහළ වෙන **සම්මා සම්බුදු රජාණන් වහන්සේ** නමක් විසින්. මේ ලෝකේ වෙන කවුරුවත් ඒ ක්‍රමය දන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ නමක් ඒ විදිහට ඉතාම කලාතුරකින් ලෝකයට පහළ වෙලා තමයි සතර අපායෙන් නිදහස් වෙන ක්‍රමය කියලා දෙන්නේ. ඒ ක්‍රමය ඔබත් අනුගමනය කළොත්,

ඔබටත් අර මුලින් කියපු අසරණකමෙන් නිදහස් වෙන්න කටයුතු කරන්න පුළුවන්. බුදු සමිඳුන් වදාළේ යම් කෙනෙක් **සෝතාපන්න වුණොත්** ඒ කෙනා **සතර අපායෙන් සදහට ම නිදහස් වෙනවා** කියල යි.

## ● ඇත්තට ම සෝතාපන්න වෙච්ච කෙනා ආයෙ කවදාවත් ම සතර අපායේ ඉපදෙන්නේ නැති ද?

නැහැ. ඒ කෙනා සදහට ම සතර අපායෙන් නිදහස් වෙනවා කියල කිව්වේ ඒ නිසයි. අපිව සතර අපායේ උපතක් කරා ගෙන යන යම් යම් හේතු තිබුන නම්, ඒ හේතූන් සියල්ල ම එයාට නැති වෙනව. ඒ නිසා ම යි එයා සතර අපායෙන් නිදහස් වෙන්නෙ. ආයෙත් එයා අතින් සතර අපායට ඇදගෙන යන ස්වභාවයේ කර්ම රැස් වෙන්නේ නැහැ.

ඒ කෙනා ආයෙමත් ඉපදෙන්නේ උපරිම වශයෙන් ආත්ම භාව හත යි. ආත්ම භාව හතක් ඇතුළත දී එයා ඉපදීම සදහට ම නැති කරලා, අර මුලින් කියපු අසරණකමින් සදහට ම නිදහස් වෙනවා. ඒ ආත්ම භාව වලදී ත් එයා උපදින්නේ මේ මිනිස් ලෝකයේත් දෙව් ලොව ත් පමණ යි. බලන්න, ඒ කෙනාට ලැබුනේ කොතරම් ඉහළ රැකවරණයක් ද?

මේ සාගරයේ මුළු ජල කඳ ම වේලිලා ගිහින් ජල බිංදු කීපයක් විතරක් ඉතුරු වුනා නම්, ඒ වේලිච්ච මහා ජල කඳ වගේ මහා දුක් ගොඩක් සෝතාපන්න කෙනාට ගෙවිලයි තියෙන්නෙ. බුදු සමිඳුන් වදාළා ඒ කෙනාට ඉතිරි වෙලා තියෙන්නෙ අර ඉතිරි වුන ජල බිංදු කීපය වගේ ඉතාමත් ස්වල්ප දුක් ප්‍රමාණයක් කියල. ඉතින් **මේ විදිහට සෝතාපන්න වෙන්න පුළුවන් වෙන්නෙත් නිවැරදිව තෙරුවන් සරණ ගිය කෙනාට** යි. හැබැයි ඔබ හොඳින් මතක තියාගන්න, මේ සංසාර ගමන ඔබට විතරක් නොවෙයි, බෞද්ධ, කතෝලික, මුස්ලිම්, හින්දු ආදී මේ **හැමෝට ම පොදු එකක්.** ඒ නිසා අපි කවුරු කවුරුත් ලෙඩ වෙද්දි, වයසට යද්දි, මරණයට පත් වෙද්දි, සතර අපායේ උපතක් කරා යද්දි පුදුම අසරණ කමකට යි පත් වෙන්නෙ. නමුත් නිවැරදිව තෙරුවන්

සරණ ගිය කෙනා එහෙම අසරණ බවට පත් වෙන්නෙ නැහැ.

## ● අපි නම් ඉතින් ගිහි ජීවිත ගත කරන අයනෙ. අපිට ඕවා අමාරුයි...

හා... හා... එහෙම කියන්න එපා. ඔබට ආයෙත් සැරයක් වැරදුනා. ගිහි ජීවිතය ගත කරන ඔබ තමා මේ ප්‍රශ්න වලින් නිතර ම පීඩාවට පත්වෙන්නේ. මොහොතක් හිතලා බලන්න. ඔබ සතුටින් හිටිය හැම විටක දි ම වාගේ ඒ සතුට නැති කරලා දාන්න මොකක් හරි දුකක් ඔබේ පස්සෙන් ආවා නේ ද? මේ ධර්මයේ හැසිරිලා සතර අපායෙන් නිදහස් වුනු සෝතාපන්න ශ්‍රාවකයින් බවට පත්වෙන්න **ගිහි-පැවිදි කියල භේදයක් නෑ.** මොකද, ගිහි-පැවිදි හැමෝම යන්නේ සංසාර ගමනක නෙ.

ඒ නිසා, මේ වැඩේ අමාරුයි කියලා හිතන්න එපා. දැන් ඔය ගිහි ජීවිතය ගත කරන අතරතුරේ ම මේ ධර්මයට අනුව හැසිරෙන්න මහන්සි ගන්න. අපි මුලින් ම කතා කළානේ, මේක පටන් ගන්න තියෙන්නේ හරි ම සරලව. මොකද, කෙනෙක් පැවිදි වුනා කියලා එයා සතර අපායෙන් නිදහස් වෙන්නෙ නැහැ නෙ. ගිහි හෝ වේවා, පැවිදි හෝ වේවා **සතර අපායේ ඉපදෙන්න වුනොත්, විඳින්න තියෙන දුකේ වෙනසක් නැහැ.** ඒ නිසා ම යි ගිහි ගෙදර වාසය කරන ඔබ කොහොම හරි මේ ධර්මය කරා පිය නැගිය යුත්තේ.

## ● ඒ වුනාට එතකොට අපේ ගිහි ජීවිත අසාර්ථක වෙයි ද? අපිට මේ ජීවිතය එපා වෙයි ද?

නැහැ. ඒක කොහොමත් ම වෙන්නේ නැහැ. ජීවිතය අසාර්ථක වීමක් නොවෙයි, ජීවිතය තව තවත් සුන්දර වීමක් ම යි සිද්ධ වෙන්නෙ. ජීවිතය අසාර්ථක වෙන්නෙ වැරදි විදිහට ජීවිතය ගත කළා ම යි. ඒ කරපු පව් මතක් වෙවී, ඒවායින් දුක් විඳිද්දී තමයි, ජීවිතය එපා වෙන්නෙ. **සෝතාපන්න කෙනාගෙ ජීවිතය බොහොම සුන්දර එකක්.** ඔබ දන්නව ද විශාඛාව ගැන? එයා සෝතාපන්න ශ්‍රාවිකාවක්. විශාඛාව සෝතාපන්න වුනේ අවුරුදු හතේ දී. එහෙම නම්, විශාල සැප සම්පත් ගොඩක් මැද්දේ හැදී

වැඩුණු විශාඛාවට යි ජීවිතයේ එපා වෙන්න ඕනෙ. ඒත් එහෙම වුනේ නැහැ. විශාඛාව විවාහ වෙලා ඉතාම සාර්ථක ගිහි ජීවිතයක් ගත කළා.

ඒ වගේ ම සෝතාපන්න ශ්‍රාවකයෙක් වූ අනේපිඬු සිටුතුමා ගේ ජීවිතය කොතරම් නම් වාසනාවන්ත එකක් ද? ඒ උදවිය ඉතාම ප්‍රීතිමත් ජීවිත ගත කරපු උදවිය. ඔබ මොහොතක් මේ ගැනත් හිතලා බලන්න. බුදුරජාණන් වහන්සේ ජීවත්වෙන කාලෙදි සැවැත් නුවර හිටිය කෝටි හතක ජනගහණයෙන්, කෝටි පහක් ම මාර්ගඵල ලාභීන්. ඒ නගරය ඒ නිසා ම බොහොම සුන්දර නගරයක් බවට පත්වුනා. බුදුරජාණන් වහන්සේගේ ගිහි ශ්‍රාවකයන්ගේ ජීවිත සුන්දර වුනේ, ඕනෑම බය තැති ගැනීමක් නැතිව ඒවාට මුහුණ දුන්න නිස යි. **ජීවිතයට එන ගැටලු වලට නො සැලී මුහුණ දෙනවා නම්, එයාගෙ ජීවිතේ කොච්චර නම් සාර්ථක ද?**

ඔබ නිවැරදිව තෙරුවන් සරණ ගියොත්, මේ සියලු සාර්ථකත්වයන් ඔබේ ජීවිතයට එක් කර ගැනීමේ හැකියාව ලැබෙනවා. මේ ගැන ඔබට ම තේරුම් ගන්න පුළුවන් ක්‍රමයක් ගැන බුදුසම්ඳුන් වදාළා. ඒකට කියන්නේ දහම් කණ්ණාඩිය කියල යි.

## ● මොකක්ද ඒ දහම් කණ්ණාඩිය?

අපි කණ්ණාඩියකින් කරන්නෙ මුහුණ බලන එක නෙ. මේ දහම් කණ්ණාඩියෙන් කරන්නෙත් තමන් ගැන සොයා බලන එක. අනුන් ගැන හොයන එක නොවෙයි. දහම් කණ්ණාඩිය සම්පූර්ණ වෙන්න කරුණු හතරක් ඕනෙ. ඒකෙන් පළවෙනි එක තමයි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය. **ඔබට ඔබ සරණ ගිය බුදුරජාණන් වහන්සේ පිළිබඳව හොඳ විශ්වාසයක් තියෙන්න ඕනෙ.** ඒ විශ්වාසය ඇති කරගන්නේ ඒ බුදුසම්ඳුන්ගේ අසිරිමත් ගුණ දැන ගෙන ඒවා මුළුමනින් ම අදහාගැනීමෙන්. (අප සරණ ගිය ඒ බුදු සම්ඳුන්ගේ අසිරිමත් සම්බුදු ගුණ අවසානයේ දක්වා ඇත.)

මේ බුදු ගුණ වලින් එකක් ගැනවත්, ඔබ අවිශ්වාස කරනවා නම්, දහම් කණ්ණාඩිය සම්පූර්ණ වෙන්නේ නැහැ. ඊළඟට ඒ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුන **ආශ්චර්යමත් ශ්‍රී සද්ධර්මයේ ගුණ දැනගෙන ඒ ගුණ මුළුමනින් ම විශ්වාස කරන්න ඕනෙ.** (ඒ අසිරිමත් සදහම් ගුණ අවසානයේ දක්වා ඇත.)

ඒ වගේ ම, **ආර්ය මහා සංඝරත්නයේ ගුණ දැනගෙන ඒවා මුළුමනින් ම විශ්වාස කරන්න ඕනෙ.** (ඒ අසිරිමත් සඟ ගුණ ද අවසානයේ දක්වා ඇත.) මෙන්න මේ විදිහට ඔබ සරණ ගිය තිසරණයේ අසිරිමත් ගුණ විසි හතර ම හොඳට දැන ගෙන ඒවා මුළුමනින් ම අදහාගන්න ඕනෙ. හතර වෙනි කරුණ තමයි, ඔබ සමාදන් වූ පංච **ශීලය ඉතාමත් හොඳින් නිකැළැල් ව, සිදුරු නැතිව, පිරිසිදු ලෙස ආරක්ෂා කරන්න ඕනෙ.** ඕක තමා දහම් කණ්ණාඩිය.

## • එතකොට මේ දහම් කණ්ණාඩියෙන් බැලුවා ම අපිට අපි ගැන මොනවද පේන්නේ?

ඔව්... ඒක හොඳ ප්‍රශ්නයක්. අපි මුලින් ම කතා කළානේ, කාරණා හතරක් සම්පූර්ණ නො වුනොත් දහම් කණ්ණාඩිය සම්පූර්ණ වෙන්නේ නැහැ කියලා. එයා මුළු හදවතින් ම බුදුරජාණන් වහන්සේව සරණ ගිහින්, මුළු හදවතින් ම ශ්‍රී සද්ධර්මය සරණ ගිහින්, මුළු හදවතින් ම ශ්‍රාවක සඟරුවන සරණ ගිහින්, ඉතා හොඳින් අවංකව සීලය ආරක්ෂා කළොත්, එයාගේ ඒ කාරණා හතර ටිකෙන් ටික සම්පූර්ණ වෙනවා.

දහම් කණ්ණාඩිය සම්පූර්ණ වුනා ම අපට ඒ තුලින් අපේ ජීවිතය දිහා බලන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ වදාළා, මේ අංග හතර තියෙන කෙනා කවදාවත් නිරයට, තිරිසන් ලෝකයට හා ප්‍රේත ලෝකයට උපතක් කරා යන්නේ නැහැ කියලා. එයාට ඒ කාරණය ප්‍රත්‍යක්ෂ වෙනවා. යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ ව සරණ ගියොත් එයා අපායෙ යන්නෙ නැහැ. මේ මිනිස් කය අත්හළ ගමන් ම දිව්‍යම ය කයක් ලබනවා කියලයි බුදු සමිඳුන් වදාළේ.

ඒ විතරක් නොවෙයි. **ජීවිතයේ විවිධ ප්‍රශ්න එද්දී, ඒවාට නො සැලී ඉන්න මේ දහම් කණ්ණාඩිය උපකාර වෙනවා.** ඇත්තට ම

මැරෙන්න පණ අදිද්දී පවා මේ දහම් කණ්ණාඩිය තියෙන කෙනා, ඒ තුලින් තමා සතර අපායේ නො යන බව දකින නිසා අමුතුවෙන් බිය වන්නේ නැහැ. තැති ගන්නේ නැහැ. නො බියව ඒ දෙයට මුහුණ දීමේ හැකියාව එයාට ලැබෙනවා. ඉතින් ඒ සඳහා මුළු හදවතින් ම තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයෙක් බවට පත්වෙන්න ඔබ දක්ෂ වෙන්න ඕනෙ.

## ● ඉතින් ඒ සඳහා මම පටන් ගන්නේ කොතැනින් ද?

බොහොම හොඳයි... ඔබට සතර අපායෙන් නිදහස් වෙලා ජීවිතයේ අසරණකමින් නිදහස් වෙන්න ඕනෑකමක් ඇති වුන හැඩයි. ඔබ බුදුරජාණන් වහන්සේ කියන්නේ කවුද කියලා අවබෝධයෙන් ම අඳුනා ගන්න ඕනෙ. **බුදුරජාණන් වහන්සේ ව දැක ගන්න තියෙන්නේ ඒ බුදු සමිඳුන් වදාළ ධර්මය තුලින්.** ඇත්තට ම ඔබට පෙනෙයි බුදු සමිඳුන් ඒ ධර්මය තුළ තවමත් ජීවමාන බව. බුදුරජාණන් වහන්සේ ව අපි හඳුනාගන්නේ ගුණ වශයෙන්. **සම්බුදු හද මඬලක තියෙන අසිරිමත් සම්බුදු ගුණ ප්‍රමාණ කළ නො හැකියි.**

ඒත් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේව, පවතින්නා වූ අසිරිමත් ගුණ නවයක් ඇසුරෙන් අපට හඳුන්වා දුන්නා. ඉතින්, අපි මූලිකව ම ඒ ගුණ ඇසුරෙනුයි බුදු සමිඳුන්ව හඳුනාගන්නේ. ඒ ඇසුරින් අපි තුළ ඇතිවන්නේ අන්ධ භක්තියක් නොවෙයි. **අපේ ජීවිත තුළ තියෙන අසරණකමට පිළිසරණක් පතාගෙන අවබෝධයෙන් ම යි අපි බුදු සමිඳුන්ව සරණ යන්නේ.** ඒ ගුණ පිළිබඳව හිත පහදින්න ඕනෙ. ඒ ඇතිවන පැහැදීමට කියන්නේ ශ්‍රද්ධාව කියලා. ඒක මිනිසෙක් විදිහට ඉපදුනු කෙනෙකුට ලැබෙනා වටිනා ම ලාභයක්.

මේ ශ්‍රී සද්ධර්මයත්, ශ්‍රාවක සඟරුවනත් අප සරණ යා යුත්තේ ඔය අයුරෙන් ගුණ වශයෙන් හඳුනාගෙන යි. ඒ අද්විතීය වූ ගුණ එකින් එක ඔබ දැනගන්නා විට ඒකාන්තයෙන් ම ඔබේ සිත ඒ පිළිබඳව පහදීවි. ඒ ඇතිවන පැහැදීම බොහෝම වටිනා දෙයක්. එතනින් තමයි අපට පටන් ගන්න තියෙන්නේ. (ඒ අසිරිමත් තෙරුවන් ගුණ ඉදිරි පිටු වල දක්වා තිබේ.)

## ● ඉතින්.... මේක ආරම්භය නම්, දිගින් දිගට ම ධර්ම මාර්ගය තුළ අපි ගමන් කරන්නේ කොහොම ද?

ඔව්... ඒක වැදගත් ප්‍රශ්නයක්. ඒ සඳහා ඔබට තවදුරටත් උපකාර කරන්න අපි සූදානම්. ඒ මේ සංසාර ගමනේ පවතින භයානක කම අපි දන්නා නිසයි. දැන් රට පුරා ම තියෙන **මහමෙව්නාව භාවනා අසපු** මගින් ඒ පිළිබඳව ඔබව දැනුවත් කරනවා. **බුදු සමිඳුන් වදාළ පිරිසිදු ධර්මය කිසිම අඩුවැඩියකින් තොරව, ඒ අයුරින් ම කියාදෙමින් ඔබට මග පෙන්වන්නට අපට පුළුවන්.**

ඒ නිසා ම, රටේ ප්‍රධාන නගර ආශ්‍රිතව භාවනා වැඩසටහන් රැසක් ම මේ වන විටත් ක්‍රියාත්මකයි. **අපගේ ගුරු දේවෝත්තම පූජ්‍යපාද කිරිබත්ගොඩ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ** මෙවන් වූ වැඩපිළිවෙලක් ඇති කළේ, දුක්ඛිත සංසාර ගමනකට කොටු වෙලා ඉන්න අපිව මේ දුක්ඛිත ඉරණමෙන් ගලවා ගැනීම සඳහා ම යි. මෙතෙක් කල් පාළි භාෂාවෙන් ම තිබූ **පිරිසිදු බුද්ධ වචනය** අපි කාටත් වැටහෙන අයුරින් ඉතාමත් නිරවුල්ව, **සරල සිංහලයට පරිවර්තනය කිරීම** ට උන්වහන්සේ කටයුතු කළේ ඒ නිසා ම යි.

කොහොම වුනත් මේ වන විට ඒ පිරිසිදු බුද්ධ වචනය ඒ අයුරින් ම ඔබට ලබා දෙන්න මහමෙව්නාව භාවනා අසපු සංවිතය සූදානම්. ඔබට දහම් මගේ ඉදිරියට ගමන් කරන්නට අවශ්‍ය දහම් දැනුම ලබා දීම පිණිස, මහමෙව්නාව සදහම් ප්‍රකාශන මගින් දහම් පොත් පත්, කැසට් පට, සංයුක්ත තැටි, MP3 ආදී මෙවලම් රාශියක් මේ වන විටත් නිකුත් කොට තිබෙනවා. දිවයිනේ ඕනෑම මහමෙව්නාව භාවනා අසපුවක් මුල්කොට ගෙන ඔබට අවශ්‍ය දහම් දැනුම ලබා ගත හැකියි. මේ වන විට අසපු සංවිතය මගින් පවත්වාගෙන යන mahamevna.org යන වෙබ් අඩවි ඇසුරු කරගනිමින් අන්තර්ජාලය හරහාත් ඔබට අප හා එක්විය හැකියි. mahamevnawa@mahamevna.org යන විද්‍යුත් තැපැල් ලිපිනයෙනුත් ඔබට අවශ්‍ය දහම් ගැටලු වලට විසඳුම් ලබා ගත හැකිය.

දුර්ලභව ලැබෙනා මිනිස් දිවියකට බුදු සසුනක් හමුවන්නේ ඉතාමත් ම කලාතුරකින් බව අපගේ බුදු සමිඳුන් වදාළා. ඒ නිසා, අපගේ ශාස්තෘ වූ ගෞතම බුදු සමිඳුන් වදාළ ඒ අමා ධර්මය ශ්‍රවණය කොට, මේ අසිරිමත් ගෞතම බුදු සසුනේ සැබෑ ම රැකවරණය ජීවිතයට ළඟා කරගැනීමට අපි අත්වැල් බැඳ ගනිමු. ගෞතම බුදු සමිඳුන්ට අනුව ම පාද තබනා සුන්දර හදවත් ඇති ශ්‍රාවක දරුවන් බවට පත් වී වාසනාවන්ත ජීවිතයක් ඇති කර ගැනීමට දැන්වත් අදිටන් කර ගනිමු.

# බුදු රජාණන් වහන්සේ ගේ අසිරිමත් සම්බුදු ගුණ

අප සරණ ගිය භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙලොව පහළ වූ **ආශ්චර්යවත් ම මනුෂ්‍යයා** යි. මේ මුළු ලෝකයේ ම යථා ස්වභාවය ඒ ආකාරයෙන් ම අවබෝධ කර ගන්නට බුදු සමිඳුන්ට හැකියාව ලැබුණා. සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පුරාවට ම පිරූ පාරමී බලය ඒ උතුම් මුනිඳාණන් පසුපස තිබුණා. දස දහසක් ලෝක ධාතුව ම කම්පා කරවමින් අපගේ බුදු සමිඳුන් ඒ අනුත්තර අමා මහ නිවන සාක්ෂාත් කළ විට, මේ මුළු මහත් ලෝකයට ම සැඟවී තිබුණු **නව මාවතක් විවර වුණා**. ඒ සනාතන විමුක්තියේ මාවත යි.

අවිද්‍යා තිමිර පටල සිඳ බිඳ දමා ලොවේ උතුම් ම මනුෂ්‍යයා බවට පත් වූ ඒ බුදු සමිඳුන් **අනන්ත වූ ගුණ සමුදායකින් යුක්තව වැඩ සිටියා.** ඒ බුදු සමිඳුන් කිසිම විටෙක බාහිර රූප ඔස්සේ තමන් වහන්සේව ශ්‍රාවකයන්ට සමීප කළේ නැහැ. ඒ අනන්ත වූ අසිරිමත් සම්බුදු ගුණ සියල්ල ම දරාගන්න තරම් අපේ සිත් පුංචි වැඩි යි. ඒ නිසා, උන්වහන්සේ තමන් වහන්සේව ලෝක වාසීන්ට හඳුන්වා දුන්නේ **අසිරිමත් ගුණ නවයක් ඔස්සේ** යි.

ඒ අසිරිමත් ගුණ නවය මේ ලෝකයේ සම්බුදු රජාණන් වහන්සේ නමක් තුළ හැර, වෙනත් කිසිම අයෙකු තුළ පිහිටන්නේ නැහැ. ඒ නිසයි, භාග්‍යවතුන් වහන්සේට **අසමසම** කියලා කියන්නේ. එදා විතරක් නොවෙයි, අදටත් මේ ලෝකයේ ඉපදෙන පින්බර මිනිසුන්ට ඒ බුදු සමිඳුන්ව මේ අසිරිමත් ගුණ නවය ඔස්සේ දැක බලා ගත හැකියි. ඒ අසිරිමත් බුදු ගුණ තුළ **උන්වහන්සේ තවමත් ජීවමාන යි.** අපිත් ඒ මහා පුණ්‍ය ලක්ෂණයන්ගෙන් යුත් ගුණ සයුරාණන් වහන්සේව සිත් පුරා දැක ගනිමු.

## අප ගේ බුදු සමිඳුන් ගේ අරහං ගුණය

බුදු රජාණන් වහන්සේ සියළු කෙලෙසුන්ගෙන් නිදහස් වී වදාළා. 'කෙලෙස්' කියල කියන්නේ හිත කෙලෙසන දේවල් වලට යි. **සිත කෙලෙසන දේවල් වලින් නිදහස් වූ සිත** තමයි ඉතාමත් ම පිරිසිඳු නිකැළැල් සිත බවට පත්වන්නේ. සිත කෙලෙසන දේවල් තුනක් මූලිකව ම අපට හඳුනාගන්න පුළුවන්. ඒවා තමයි, රාගයත්, ද්වේෂයත්, මෝහයත්. මේ **සිත අපිරිසිඳු කරන දේවල් තුනෙන් ම** බුදු සමිඳුන් **පරිපූර්ණ වශයෙන් ම නිදහස් වී වදාළා.**

'රාගය' කියල කියන්නේ විවිධ දේවල් වලට සිත ඇදිලා යන ගතිය. ඇළුම් කරන ගතිය. අපි මේ ඉපදිලා ගතවුනු කාලය තුළ මොනතරම් නම් දේවල් වලට ඇළුම් කළා ද? ඒ නිසා ම, මොනතරම් නම් දේවල් පස්සේ හති දම දමා දිව්ව ද? නමුත්, බුදු සමිඳුන් රාගය සම්පූර්ණයෙන් ම ප්‍රහාණය කළා. සම්බුදු රජාණන් වහන්සේ ගේ නෙත් සඟල හරිම සුන්දර යි. මේ ලෝකයේ තිබුණ ලස්සන ම ඇස් දෙක තිබුණේ උන්වහන්සේට යි. අපි ඒ නෙත් වලට කියනවා **අභිනීල නෙත්** කියලා. ඒ කියන්නේ, ඉතාමත් සුන්දර නිල්පාට ඇස් දෙකක් තමයි උන්වහන්සේට තිබුණෙ. ඒ ඇස් දෙකෙන් බුදු සමිඳුන් දුටුවේ **මේ ලෝකය විතරක් නොවෙයි.**

මිනිස් ඇස ඉක්මවා ගිය **පිරිසිදු දිවැස** ඉතාම හොඳින් උපදවාගෙන තිබුණ නිසා, අපගේ ශාස්තෘන් වහන්සේට විවිධාකාරයේ දිව්‍යලෝක, බ්‍රහ්ම ලෝක ආදියත්, ඒවායේ උපන් **දෙවිවරුන් ඉතාමත් ඉහළ සැප සම්පත් විඳිනා අයුරු**ත් දැක ගන්න ලැබුණා. නමුත්, සම්බුදු සමිඳුන්ගේ ඒ අසිරිමත් බුදු සිතේ ඒ කිසිම දෙයකට **ඇල්මක් ඇති වුනේ නැහැ.** ඒකට හේතුව, බුදු සමිඳුන් රාගය **නැවත කිසිදාක ඇති නොවෙන අයුරින්** මුළුමනින් ම නැති කොට තිබීම යි.

දඹදිව් තලයේ පරිසරය ඉතාමත් කටුක යි. දූවිලි පිරුන මංමාවත් පසු කරමින් **මහා අනුකම්පාවක් උපදවාගෙන**, බුදු සමිඳුන් ගමින් ගමට වැඩියේ **පාවහන් පැළඳගෙන නොවෙ** යි. පිඬු සිඟා ගෙයින් ගෙට වැඩම කරද්දී, **පුන් සඳ මඬලක්** තමන් ගේ නිවසට පැමිණුනා හා සමානව ඒ මිනිසුන්ට දැනෙන්නට ඇති. ඒ නිසා ම,

තමන්ට හැකි පමණින් දානය පිළිගන්නවලා, ඒ මිනිසුන් මහත් වූ පුණ්‍ය ධර්මයන් රැස් කරගත්තා. නමුත්, අසරණ මිනිසුන් සිටිය මංමාවත් වල දී දවසට ම ලැබුනේ ඉතාමත් ස්වල්ප ආහාර ප්‍රමාණයක්. ඇතැම් විට, රජ ගෙදර දී ප්‍රණීත ආහාර පාන පාත්‍රය පුරාවට ලැබුණා. නමුත්, ඒ කිසිදෙයකින් සම්බුදු සිතේ **අමුතු ගැටීමක්වත් ඇලීමක්වත් ඇති වුනේ නැහැ**. අසිරිමත් සම්බුදු සමිඳුන් ගේ සුන්දර ගුණ කඳ හඳුනා ගන්නට අපොහොසත් වූ, පව්කාර මිනිසුන් මෙකල වගේ ම එදා ත් සිටියා. ඒ පව්කාර මිනිසුන් තමන් ගේ පාපී අදහස් ඉටුකර ගන්නට බුදු සමිඳුන්ට විවිධාකාරයෙන් කරදර කරන්නට පටන් ගත්තා. ඒත්, ඒ කිසි කෙනෙකුට බුදු සමිඳුන් ගේ සිතේ **තරහවක්, ද්වේෂයක් උපදවන්නට නො හැකි වුණා**. ඒ කරදර කම්කටොළු සියල්ල ම පාහේ අනන්ත පාරමී බලයකින් යුතු බුදු සමිඳුන් ඉදිරියේ දී, හිරු දුටු පිණි බිඳු වගේ නො පෙනී ගියා. ඒ සම්බුදු හද මඬලින් ගලා ගියේ **අප්‍රමාණ මෛත්‍රියක්.** ඒ මෙත් කැන් දහරා, මුළු මහත් තුන් ලොවේ ම **සුවහසක් දුකින් පෙළෙනා හදවත් සනහාලමින්** ඇදී ගියේ අප්‍රමාණ ශාන්තියක් කැන්දවමිනු යි. ඒකට හේතුව, බුදු සමිඳුන් **ද්වේෂය මුළුමනින් ම ප්‍රහාණය කොට තිබීම** යි.

මේ ලෝකයේ හැමෝම වගේ ජීවත් වෙන්නේ, මේ ලෝකයට ම මුලා වූ සිතිනු යි. තමන් මුලා වූ බව බොහෝ දෙනෙකුට නො තේරෙන්නේ, ඒ මුලාව ඒ තරමට ම ප්‍රබල නිස යි. මේ රැවටෙන ගතිය නිසා ම යි, අපි මේ දුක්ඛිත සංසාර ගමනට තවමත් ඇළුම් කරන්නේ. ඒ රැවටෙන ස්වභාවයට කියන්නේ මෝහය කියල යි. අපගේ බුදු සමිඳුන් මේ **ලෝකයේ ඇත්ත ස්වභාවය** තමා තුලින් ම දැක ගත් උත්තමයන් වහන්සේ යි. උන්වහන්සේ **මෝහය සම්පූර්ණයෙන් ම දුරු කළා**. විද්‍යාව උපදවා ගත්තා. ඒ නිසා මෝහය නිසා ඇති වන කෙලෙස් සියල්ලමත් බුදු සමිඳුන්ට ප්‍රහීණ යි. ඒ ශාන්ති නායකයන් වහන්සේ **දිවි ගෙව්වේ මුලාව දුරු වුණ සිතින්.**

මේ අයුරින් **සියලු ම ආකාරයේ සිත කෙලෙසන දේවල් වලින්** බුදු රජාණන් වහන්සේ **නිදහස් වී වදාළා**. රහසින්වත් පව් කළේ නැහැ. සියලු ම කුසල් දහම් උපදවා ගත්තා. ඒ නිසා ම, ඇස,

කණ, නාසය, දිව, කය හා මනස කියන මේවට තිබෙන ඇල්මත්, ගැටෙනා ගතියත්, රැවටෙන බවත් මුළුමනින් ම දුරු කළා. මේ නිසා ම තමයි බුදු සමිඳුන් සියලු දෙවි මිනිසුන් ගේ සියලු ම ආකාරයේ **ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා ලැබීමට සුදුසු වන්නේ.**

මෙවන් වූ **සුන්දර නිකෙලෙස් දිවි පෙවෙතක්** ගත කළ නිසා අපේ බුදු සමිඳුන් **අරහං** නම් වූ ගුණයෙන් යුක්තයි කියලා හිත පහදවා ගන්න ඕනෙ. මෙවන් අසිරිමත් වූ පිවිතුරු දිවියක් ගත කළ **සම්බුදු රජාණන් වහන්සේව** අපි **මුළු හදවතින් ම සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ සම්මා සම්බුද්ධ ගුණය

මේ **ලෝකයේ පවතින යථාර්ථය** නම්, **චතුරාර්ය සත්‍යය** යි. ලෝකයේ **කවුරුවත් දැනගෙන සිටියෙ නැති**, සෑම කාලයක දී ම ලෝකය තුල පවතින මේ සනාතන සත්‍යයන් **අවබෝධ කර ගත්තේ**, බුදු රජාණන් වහන්සේ විසිනු යි. **සැඟවිලා තිබුණු වටිනා නිධානයක්** මතු කර ගන්නවා වගේ, මේ **අසිරිමත් ධර්මය සම්බුදු සිත තුළ මෝදු වුනා**. බුදු සමිඳුන් මේ ධර්මය අවබෝධ කළේ, **කාගෙන්වත් අහලා නොවෙයි**. සම්පූර්ණයෙන් ම, **ගුරු උපදේශ රහිත** ව යි. ජීවිතයේ ඇත්ත ගැන දන්න කෙනෙක්, ඒ කාලයේ මේ ලෝක ධාතුවේ පහළ වෙලා සිටියේ නැහැ. ඒ නිසා, බුදු සමිඳුන් මේ චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කළේ **තමා තුළින් ම** යි. කිසිදු ගුරු උපදේශයකින් තොරව යි.

ඒ චතුරාර්ය සත්‍යය ධර්මය මෙසේ යි.

01. කිසිදාක වෙනස් නො වන සත්‍යයක් ලෙස ලොව තුල පවතින, **අවබෝධ කළ යුතු වූ දුක නම් වූ ස්වභාවය**

02. කිසිදාක වෙනස් නො වන සත්‍යයක් ලෙස ලොව තුල පවතින, **ප්‍රහාණය කළ යුතු ඒ දුකේ හට ගැනීම**

03. කිසිදාක වෙනස් නො වන සත්‍යයක් ලෙස ලොව තුල පවතින, **සාක්ෂාත් කළ යුතු දුකේ නිරුද්ධ වීම** නම් වූ අමා මහ නිවන

04. කිසිදාක වෙනස් නො වන සත්‍යයක් ලෙස ලොව තුල

පවතින, **ප්‍රගුණ කළ යුතු වූ දුක නිරුද්ධ වන ප්‍රතිපදාව**

මෙන්න මේ සනාතන සත්‍යයන් හතරට තමයි චතුරාර්ය සත්‍යය කියලා කියන්නේ. **සත්‍ය ඤාණ, කෘත්‍ය ඤාණ, කෘත ඤාණ** වශයෙන් **පරිවර්ත තුනකින්** යුතුව **ආකාර දොළොසකින්** ඒ චතුරාර්ය සත්‍යය ධර්මය, **කිසිදු උපකාරයකින් තොරව** අවබෝධ කළේ බුදුරජාණන් වහන්සේ යි. උන්වහන්සේ අවබෝධ කළේ, කිසිදු පොතක පතක තිබුන දෙයක් නොවෙයි. ආධ්‍යාත්මයේ **තමා තුළ ම උපදවා ගත් ඤාණ දර්ශනයන්** ඇසුරෙනු යි, බුදු සමිඳුන් මේ අසිරිමත් දහම කිසි ම ආකාරයක ගුරු උපදේශයක් නැතිව ම අවබෝධ කළේ. සැබවින් ම බෝ රුකක් යට වැඩ හිදිමින් පුන් සඳ පායපු රාත්‍රියක දී, මේ කළ **සොයා ගැනීම අසිරිමත් එකක්.** මේ අයුරින් සම්බුදු සිතක මෝදු වූ, ආර්යය වූ පර්යේෂණයේ අවසන් ප්‍රතිඵලය තමයි, **සියළු දුකින් මුළුමනින් ම නිදහස් වූ** ගෞතම නම් වූ **සම්මා සම්බුදුරජාණන් වහන්සේ** ව ලොවට දායාද වීම. ඉතින්, මේ නිසා තමයි බුදු සමිඳුන් ට **සම්මා සම්බුද්ධ** කියල කියන්නේ. ඒ පිළිබඳව අපි සිත පහදවා ගනිමු. සම්මා සම්බුද්ධ වූ අසිරිමත් මුනිවරයන් වහන්සේ ව **මුළු හදවතින් ම සරණ යමු.**

## අප ගේ බුදු සමිඳුන් ගේ විජ්ජාචරණ සම්පන්න ගුණය

ඒ බුදු සමිඳුන්, **අෂ්ඨ විද්‍යාවන්**ගෙනුත් **පසළොස් චරණ ධර්මය**න්ගෙනුත් යුක්ත යි. තමන් වහන්සේ යමක් අවබෝධ කළා නම්, එයට ගැලපෙන අයුරින් ම යි ජීවිතය ගත කළේ. **අවබෝධයට අනුව ම හැසිරෙන අය** මේ ලෝකයේ ගොඩක් දුර්ලභ යි. අද බොහෝ දෙනා හැසිරෙන්නේ අවබෝධයක ට අනුව නො වෙයි.

- අප ගේ බුදුරජාණන් වහන්සේ ට පෙර ජීවිත දැකීමේ හැකියාව තිබුණා. **(පුබ්බේ නිවාසානුස්සති ඤාණය)**
- සියලු ලෝක සත්වයන් චුත වන ආකාරයත්, උපදින ආකාරයත් දැකීමේ හැකියාව තිබුණා. **(චුතූපපාත ඤාණය)**
- ඒ බුදු සමිඳුන්, දුර තිබෙන දේත්, ළඟ තිබෙන දේත් බාධාවකින් තොරව දැකීමේ හැකියාවෙන් යුක්ත යි. **(දිබ්බචක්ඛු ඤාණය)**

- ඕනෑම දුරක තිබෙන ශබ්දත්, ළඟ තිබෙන ශබ්දත් බාධාවකින් තොරව ඇසීමේ හැකියාවෙන් යුක්ත යි. **(දිබ්බසෝත ඥාණය)**

- දෙව් මිනිස් ආදී සියලු සත්වයන් ගේ, සිත් වල ස්වභාවය දැකීමේ හැකියාවෙන් යුක්ත යි. **(පරචිත්ත විජානන ඥාණය)**

- දෙව් මිනිස් සියලු සත්වයන් ගේ, සිත් තුළ වූ කෙළෙස් සැඟවී පවතින ආකාරය දැකීමේ හැකියාව උපදවා ගත්තා. **(ආසයානුසය ඥාණය)**

- දෙව් මිනිස් සියලු සත්වයන් තුළ, මේ සුන්දර ධර්මය **අවබෝධ කිරීමේ කුසලතාවය** තිබෙන ආකාරයත්, නො තිබෙන ආකාරයත් දැකීමේ හැකියාවෙන් යුක්ත යි. **(ඉන්ද්‍රියපරෝපරියත්ති ඥාණය)**

- තමන් වහන්සේ තුළ පැවති සියලු ආකාරයේ ආශ්‍රවයන් මුළුමනින් ම ප්‍රහාණය කිරීම සිදු කොට වදාළා. **(ආසවක්ඛය ඥාණය)**

- ඒ වගේ ම, අහසින් ගමන් කිරීමේ හැකියාව, ජලයේ සක්මන් කිරීමේ හැකියාව, පොළවේ කිමිදී වෙනත් තැනකින් මතු වීමේ හැකියාව, සියල්ල විනිවිද නො පෙනී ගමන් කිරීමේ හැකියාව ආදී කොට ඇති අනන්ත **සෘද්ධි ප්‍රාතිහාර්යය** පෑමේ හැකියාවෙන් යුක්ත වුවා. **(සෘද්ධිවිධ ඥාණය)**

මේ ආදී කොට ඇති විවිධාකාර ඥාණ දර්ශනයන් රැසක් ම සම්බුදු හද මඬල තුළ ඉපදුනේ නිරායාසයෙන් ම යි. මෙවන් වූ **අනන්ත ඥාණයන්ගෙන් සමන්විත වූ** බුදු සමිඳුන්, ඒ **ඥාණයන්ට අනුව ම තම ජීවිතය ගත කළා**. සොඳුරු චරණ ධර්මයන්ගෙන් යුතු වුනා.

ඒ බුදු රජාණන් වහන්සේ ගේ වචන **ඉතාමත් මිහිරි යි.** බොරුවෙන් තොර යි. කේළාම් කීමෙන් තොර යි. පරුෂ වචන වලින් තොර යි. **නුවණැස පාදා දෙන ස්වභාවයෙන් යුක්ත යි**. අර්ථ ශූන්‍ය වූ හිස් ප්‍රලාප ඒ සම්බුදු වචනය තුළ තිබුණෙ නැහැ.

කෙලෙස් සංසිඳුවාලන, **සමාධිය ඇති කරවන**, මට සිළුටු, **කණට ප්‍රිය උපදවන්නා වූ** ස්වභාවයෙන් ම යුතු වචන නිරන්තරයෙන් ම සම්බුදු මුව මඬලින් පිටවූයේ, හිස් වා තලය ම සුවඳවත් කරවමිනු යි.

මහා කරුණාබර වූ බුදු සමිඳුන් **කිසිවෙකුටවත් ශාප කළේ නැහැ.** දඬුවම් කළේ නැහැ. අච්චු දුන්නේ නැහැ. **එවන් වූ පාපී හැසිරීම් තිබෙන්නේ කෙළෙස් සහිත අය තුළ යි**. නිකෙලෙස් වූ සම්බුදු සමිඳුන් සියලු ම ආකාරයේ හිංසා වලින් දුරු වූ, **අබ්‍රහ්මචාරී පැවැත්මෙන් දුරු වූ,** මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් දුරු වූ, මිත්‍යා ආජීවයෙන් දුරු වූ **පරම පාරිශුද්ධ දිවියක් ගත කළා**.

**මෛත්‍රී සහගතව** ම කය හැසිර වූ, වචනය හැසිර වූ, සිත හැසිර වූ ඒ බුදු සමිඳුන්, **අවබෝධයට ගැලපෙන ලෙසට ම ජීවිතය ගත කළ බව** අප කවුරුත් දන්නවා. ඒ නිසා, අප ගේ බුදු සමිඳුන් ගේ ඒ විජ්ජාචරණ සම්පන්න නම් වූ අසිරිමත් සම්බුදු ගුණය පිළිබඳව **සිත පහදවා ගනිමු**. මේ සම්බුදු ගුණ මේ ලෝකයේ පහළ වූ, කිසිම අන්‍ය ශාස්තෘන් වහන්සේ නමක් තුළ දැකිය නො හැකියි. මෙවන් වූ අසිරිමත් හැකියාවලින්, ඤාණයන්ගෙන් හා දිවිපැවැත්මෙන් යුතු වූ වෙනත් ශාස්තෘන් වහන්සේ නමක් පිළිබඳ ව ඔබ අසා නො තිබෙනවාට කිසිදු සැකයක් නැහැ. ඒ නිසා **විජ්ජාචරණ සම්පන්න** වූ බුදු සමිඳුන් ව **මුළු හදවතින් ම සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ සුගත ගුණය

ඒ භාග්‍යවතුන් වහන්සේ **සුන්දර මාර්ගයක ගමන් කොට** පරම **සුන්දර වූ අමා මහ නිවනට** පැමිණ වදාළා. රාග, ද්වේෂ, මෝහාදී කෙළෙසුන් දුරු කිරීම පිණිස පවතින්නා වූ, **සීල, සමාධි, ප්‍රඥාවෙන් යුක්ත වූ**, මුළුමනින් ම **සුන්දර වූ නිකෙලෙස් දිවියක්** කරා ගෙන යන්නා වූ **ආර්ය අෂ්ඨාංගික මාර්ගය** සොයා ගත්තේ, සම්බුදු සමිඳුන් විසින් ම යි. එම **නිකැළැල් මාර්ගයේ ගමන් කොට**, හැම අතින් ම විසිතුරු වූ අමා මහ නිවන සාක්ෂාත් කළ නිසා ම භාග්‍යවතුන් වහන්සේ ව, **'සුන්දර මාර්ගයක ගමන් කළ කෙනා'** (සුගත) කියල හඳුන්වනව. ඒ සුන්දර ගති ඇති **සුගත**යන් වහන්සේ ව අපි **මුළු හදවතින් ම සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ ලෝකවිදූ ගුණය

මේ **ලෝක ධාතුව තුළ කිසිදු රහසක් නො තිබෙන තරමට ම** තම සිත දියුණු කරන්නට බුදු සමිඳුන් ට හැකි වුණා. කෙළෙස් සහිත විද්‍යාඥයන් තවමත් මේ ලෝකය පිළිබඳවත්, මේ ලෝකයෙන් එහා දේ පිළිබඳවත් පරීක්ෂණ පවත්වමින් සොයා බලන්නේ, ඒ පිළිබඳව ඒ උදවිය නො දන්නා නිස යි. ඒ පිළිබඳව දන්නා අයෙකුට, අමුතුවෙන් නිරීක්ෂණ අවශ්‍ය වන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ මේ ලෝකය පමණක් නොව, විශ්වය පුරාවට විසිරී පවතින **සියලු ලෝක අවබෝධ කළා**.

ඒ ලෝක වල ස්වභාවය විතරක් නො වෙයි, ඒ ලෝක වල **උපතට හේතුව**ත්, ඒ ලෝක වලින් **නිදහස් වන ආකාරය**ත්, අවබෝධ කරගත් අප ගේ ශාස්තෲන් වහන්සේ ඒ සියලු ලෝකයන් ගෙන් නිදහස් වී වදාළා. **සදහට ම නිදහස් වුණා**. බ්‍රහ්ම ලෝක, දිව්‍ය ලෝක, මිනිස් ලෝකය, ප්‍රේත ලෝක, තිරිසන් ලෝකය, නිරය ආදී ලෝකයන් පිළිබඳ ව පරිපූර්ණ අවබෝධයක් ඒ සම්බුදු සිත තුළ ඉපදී තිබුණා.

ඒ **සියලු ලෝක**යන් පිළිබඳ ව වූ **සියලු රහස් හෙළි කළ** සුගත වූ ශාස්තෲන් වහන්සේ ගේ ලෝකවිදූ ගුණය පිළිබඳ ව සිත පහදවා ගනිමු. ඒ **ලෝකවිදූ** වූ මුනිරජාණන් වහන්සේ ව **ආදරයෙන් සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ අනුත්තරෝ පුරිසදම්ම සාරථී ගුණය

ලෝකයේ කවදත් අකීකරු අය ඉන්නව. ඒ මේ ලෝකයේ විතරක් නොවෙයි, කෙළෙස් සහිත වූ සෑම ලෝකයක් ම අකීකරු අයගෙන් නම් අඩුවක් නැහැ. භාග්‍යවතුන් වහන්සේ ඒ කාලයේ සිටි බොහෝ **අකීකරු දෙවියන් වත්, මිනිසුන් වත්** අල්ප මාත්‍රයක **හිංසාවකින් තොරව,** පීඩාවකින් තොරව **දමනය කොට වදාළා**. අසිරිමත් සම්බුදු බලයෙන් දමනය වූ ඒ සියලු දෙනා ම ලෝකය ම ලස්සන කළ **සුන්දර චරිත** බවට පත්වුණා. බොහෝ දෙනෙක් මේ දහම් මගේ හික්මිලා **සියලු දුකින් නිදහස් වුණා.**

ඒ බුදු සමිඳුන් දුසිල්වතුන් **සිල්වත්** කළා. අකීකරු උදවිය **කීකරු** උදවිය බවට පත් කළා. නපුරු උදවිය **දයාවන්තයින්** බවට පත් කළා. මසුරු අය **දානපතියන්** බවට පත් කළා. නුවණ නැති අය **ප්‍රඥාවන්තයින්** බවට පත් කළා. සසර දුකට වැටී සිටි **අසරණ සත්වයන්**ට එයින් නිදහස් වී **අමා නිවන කරා යෑමට මග පෙන්වා වදාළා**. බුදු සමිඳුන් එසේ දමනය කළේ අවි ආයුධ භාවිතා කොට නොවේ. ඒ සඳහා කිසිම විටක දී කිසිවෙකුට වත් ශාප කළේ වත්, අච්චු දුන්නෙ වත්, දඬුවම් කළේ වත් නැහැ. ඒ සියල්ල සිදු කළේ **අප්‍රමාණ කරුණාවකින්** යුතුව **පරම අවිහිංසාවෙන්** ම යි.ඒ සඳහා වෙන කිසිවෙකුට වත් නැති තරමට දියුණු වූ අපූර්ව හැකියාවල් තුනක් බුදු සමිඳුන් තුළ පිහිටා තිබුණා.

ඒවා නම්,

1. අහසින් ගමන් කිරීම, ජලයේ සක්මන් කිරීම ආදී මිනිස් ස්වභාවය ඉක්මවා ගිය විස්මිත හැකියාවල් රැසකින් යුතු **ඍද්ධි ප්‍රාතිහාර්ය ය.**

2. අනුන් ගේ සිත් සතන් කියවා බලා දහම් දෙසීම නම් වූ **ආදේශනා ප්‍රාතිහාර්ය ය.**

3. ශ්‍රී සද්ධර්මය ම විස්තර වශයෙන් මනාකොට දේශනා කිරීම නම් වූ **අනුශාසනා ප්‍රාතිහාර්ය ය.**

මේ ආදී වූ **විස්මිත හැකියාවල්** බුදු සමිඳුන් සතු වුවත් උන්වහන්සේ වඩාත් ම අගය කළේ අනුශාසනා ප්‍රාතිහාර්ය යි. මේ අයුරින් දමනය වූ අය අතර අංගුලිමාල, උරුවෙල් කාශ්‍යප, ආලවක යක්ෂයා සහ නලාගිරි ඇතා ආදීන් ප්‍රධාන යි. නමුත්, අදටත් බුදු සමිඳුන් ගේ ඒ **අසිරිමත් ශ්‍රී සද්ධර්මය** ශ්‍රවණය කරනා **සුවහසක් පිරිසක්** දුසිල්වත්කම් අත්හැර **සිල්වත් වෙන හැටි** සැබැවින් ම අසිරිමත්. එනම්, අදටත් ඒ අසිරිමත් පුරිසදම්ම සාරථී ගුණය මේ **ලොව තුළ විද්‍යමාන යි**.

මොහොතක් සිතා බලන්න. බුදු සමිඳුන් නිසා **ප්‍රාණඝාතය අත්හළ අය** නිසා, ලෝකයේ කී දහසක් නම් සත්වයන් අදත් **සුව සේ ජීවත් වෙනවා** ද? කොපමණක් නම් සත්ව පිරිසක් **ජීවිත දානය**

**ලබනවා** ද? තෙරුවන් සරණ ගිය බෞද්ධයන් අතින්, දියේ වැටී පණ අදිනා කුරා කුහුඹුවාගේ සිට සුවහසක් ප්‍රාණීන්ට ජීවිතය දානය ලැබීම සැබැවින් ම **බුදු සමිඳුන්ගේ ම අසිරිය** මිස වෙන කුමක් ද? මෙතරම් හොඳින් අප ව දමනය කළ **අනුත්තර පුරිසදම්ම සාරථී** වූ ඒ බුදු රජාණන් වහන්සේට **නමස්කාර වේවා!**

## අප ගේ බුදු සමිඳුන් ගේ සත්ථා දේවමනුස්සානං ගුණය

මිනිසුන් ලෙස මෙලොව උපන් අප මිනිස් ලොවට පැමිණියේ කොහි සිට දැ යි නො දන්නෙමු. එමෙන් ම, මේ මිනිස් ලොවෙන් සමුගෙන යන විට, ඒ යන තැන පිළිබඳ ව ද නො දන්නෙමු. **අන්ධයින් සේ** ආ මග නො දැන, යන මග නො දැන **දුක්ඛිත සංසාර ගමනක් ගමන් කරනා** අප වැනි මිනිසුන්ටත්, **දෙව් ලොව දෙවියන්ට**ත්, මේ නො නවතින ගමන පිළිබඳව **අනුකම්පාවෙන් කරුණු පහදා දුන්නේ**, බුදු රජාණන් වහන්සේ ම ය.

සංසාර දුකින් පීඩා විඳිමින් දුක්ඛිත ගමනක යන අපට ඒ ගමන **නවතන මග** පෙන්වා දෙන්නේ ඒ බුදු සමිඳුන් ය. ඒ නිසා ම සාරිපුත්ත, මොග්ගල්ලාන ආදී **පින්වත් මහරහතන් වහන්සේලා** සුවහසක් මේ **ලෝ තලයේ බිහි විය.** මිනිසුන් මෙන් ම **දෙවියන් විශාල ප්‍රමාණයක්** ද, මේ දිවියේ **යථා ස්වභාවය අවබෝධ කළෝ ය**. තව්තිසා දෙව් ලොව පංචසිඛ නම් ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයා ගේ පටන් සක් දෙව් රජු දක්වා ත්, අනෙකුත් දිව්‍ය ලෝක වල බොහෝ දෙවිවරුත්, සුද්ධාවාස බ්‍රහ්ම ලෝක වල සනත් කුමාර ආදී මහා බ්‍රහ්ම රාජයනුත්, **මුළු හදවතින් ම සරණ ගියේ** ඒ භාග්‍යවතුන් වහන්සේව යි.

එවන් වූ ගුණ රැසකින් යුත්, දෙව් මිනිසුන් ගේ **එක ම ගැලවුම්කරුවා** වූ, **එක ම මග පෙන්වන්නා** වූ සම්බුදු සමිඳුන් පිළිබඳ ව **සිත පහදවා ගනිමු**. ඒ අසිරිමත් **සම්බුදු පෙළහරට එක් වී** අප ගේ ශාස්තෘ වූ **සම්බුදු සමිඳුන් සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ අසිරිමත් බුද්ධ ගුණය

තමන් වහන්සේ අවබෝධ කරගත් ඒ අසිරිමත් වූ ධර්මය, **මනා කොට දේශනා කිරීමේ හැකියාව** බුදු සමිඳාණන් සතු විය.

සැබැවින් ම, ඒ හැකියාව අසිරිමත් ය. මේ **චතුරාර්ය සත්‍යය ධර්මය ම** විවිධාකාරයට බෙදා දක්වමින්, **විග්‍රහ කරමින්** දේශනා කළ සැටි **සැබැවින් ම අසිරිමත්** ය. ලෝකයේ බොහෝ දෙනාට විවිධ දේ පිළිබඳ ව යම් දැනුමක් ඇතත්, ඒවා ඒ අයුරින් ම කියා දීමේ හැකියාව නැත්තේ ය. නමුත්, **සියල්ල දත් බුදු සමිඳුන්** එයින් අපට අවශ්‍ය කොටස මනා කොට බෙදා දක්වමින්, විග්‍රහ කරමින්, පැහැදිලි වචන වලින්, **පැහැදිලි අර්ථ වලින්** පිරිසිදු නිවන් මග ම මතු කරමින් **දේශනා කළ අයුරු** කාගේත් **සිත් පැහැද වීමට සමත් ය**.

දිනක්, ඇට්ටේරියා වනයේ දී වනය පුරාවට වැටී තිබුණු අට්ටේරියා කොළ වලින් මිටක් අතට ගත් බුදු සමිඳුන් වදාළේ, මේ මහා ඇට්ටේරියා වනය තරම් ම දෙයක් තමන් වහන්සේ අවබෝධ කළේ නමුත් එයින්, දේශනා කොට වදාළේ අතට ගත් ඇට්ටේරියා කොළ මිට තරම් සුළු ප්‍රමාණයක් බව යි. නමුත්, ඒ තුළ සංසාර දුකින් නිදහස් වීමට **අවශ්‍ය සියලු කරුණු අඩුවක් නැතිව ඇතුළත් ව ඇති බව** උන්වහන්සේ වදාළ සේක.

සූත්‍ර පිටකය තුළ පමණක් **උතුම් සම්බුදු දෙසුම් දහඅටදහස ඉක්මවා** ඇත්තේ ය. කිසිදු පරස්පරතාවයකින් තොරව එම දෙසුම් එකින් එකට ගැලපී යන සැටි දකිනා විට බුදු සමිඳුන් ගේ **විස්මිත දේශනා කෞෂල්‍යය** පිළිබඳ ව සිත නො පහදින්නේ කාගේ ද? චතුරාර්ය සත්‍යය ධර්මය බෙද බෙදා දේශනා කළ **බුද්ධ** නම් වූ ලෝකනාථයන් වහන්සේ ව **මුළු හදවතින් ම සරණ යමු**.

## අප ගේ බුදු සමිඳුන් ගේ අසිරිමත් භගවා ගුණය

භාග්‍යවතුන් වහන්සේ වනාහී මේ ලෝකයේ විසූ **වාසනාවන්ත ම මනුෂ්‍ය රත්නය** යි. **සියලු දේ අවබෝධ කර ගැනීමට** තරම් **භාග්‍ය සම්පන්න වූ** ඉසිවරයාණන් වහන්සේ බුදු සමිඳුන් ය. අනන්ත වූ **ඤාණයෙනුත්**, අනන්ත **ගුණයෙනුත්** යුතුව වැඩසිටීමට තරම් උන්වහන්සේ භාග්‍යවන්ත විය.

**දෙතිස් මහා පුරිස ලකුණින් බැබලී ගිය** සිරුරකින් යුතු වූ බුදු රජාණන් වහන්සේ, අනන්ත රූප සෝභාවෙන් යුතු වූ මේ **ලෝකයේ**

**සුන්දරතම මනුෂ්‍යයා** යි. සියලුම ලෝක ධාතූන් අවබෝධ කොට, ඒ සියලු ලෝකයෙන් නිදහස් වූ බුදු සමිඳාණන් කිසිවෙකුට **සම කළ නො හැකි සීලයකින්** ද, **සමාධියකින්** ද, අනන්ත වූ **ප්‍රඥාවකින්** ද සමන්විත වන්නට තරම් **භාග්‍යවන්ත විය.**

මේ ලොවේ මිනිසුන් ද, දෙව් ලොවේ දෙවියන් ද, ආදරයෙන් සරණ ගිය **අනන්ත පුණ්‍ය ලක්ෂණයන්ගෙන් යුත්**, මේ සියලු බුදු ගුණ දැරීමට තරම් **භාග්‍යවන්ත වූ බුදු සමිඳුන්** පිළිබඳව **සිත පහදවා ගනිමු**. ඒ භාග්‍යවත් වූ බුදු සමිඳුන් ව **ආදරයෙන් සරණ යමු.**

**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ට මාගේ නමස්කාරය වේවා!**

# ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ අසිරිමත් සදහම් ගුණ

අප ගේ බුදු රජාණන් වහන්සේ **තමන් වහන්සේ අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මය**, ලෝක වාසීන් කෙරෙහි මහා කරුණාවෙන් දේශනා කොට වදාළා. එදා පස්වග මහණුන් අරඹයා බරණැස ඉසිපතන නම් වූ මිගදායේ සිට අවදි වූ **ඒ අසිරිමත් සදහම් ස්වරය** පුරා වසර හතලිස් පහක් පුරාවට ම ලෝ සතුන් ගේ සිත් සතන් නිවා සනහාලමින් **අමා දම් රස ලබා දුන්නා**.

ඒ ශ්‍රී සද්ධර්මය ලොව පවතින **අනෙකුත් විෂය පථයන් ඉක්මවා යන** අනන්ත ගුණයන්ගෙන් යුක්ත යි. ලෝකයේ කිසිදු විෂය පථයක නොමැති ඒ අසිරිමත් ගුණ අතුරින් **ගුණ හයක් ඇසුරෙන්** බුදු සමිඳුන් **ශ්‍රී සද්ධර්මය පිළිබඳව** පැහැදිලි කොට දුන්නා. මේ ගුණ හය, බුදු දහමේ හැර ලෝකයේ කිසිදු දහමක් තුළ හෝ කිසිදු විෂයයක් තුළ දැකිය නොහැකි යි. ඒ නිසා ම යි අප ඒ **ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මය** නම් වූ **වටිනා රත්නය ආදරයෙන් සරණ යන්නෙ**.

## ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ ස්වක්ඛාත ගුණය

මේ ශ්‍රී සද්ධර්මය **මනාකොට දේශනා කරන ලද්දක්**. එහි **මුල, මැද, අග මනාව ගැලපෙනවා**. මුලත් සුන්දර යි. මැදත් සුන්දර යි. අගත් සුන්දර යි. නමුත් ලෝකයේ බොහෝ විෂයයන් තුල හා වෙනත් ධර්මයන් තුල මුලින් කියන දේ මැදට ගැලපෙන්නේ නැහැ. මැද කියන දේ අගට ගැලපෙන්නේ නැහැ. අග කියනා දේ මුලට ගැලපෙන්නේ නැහැ. නමුත්, මේ ශ්‍රී සද්ධර්මය ඊට වඩා වෙනස්. බුදු සමිඳුන් වදාළ දහඅටදහසක් පමණ වූ සූත්‍ර

දේශනා තුළ නො ගැලපෙන්නා වූ **මූලික ඉලක්කයෙන් බැහැර වූ එකදු දේශනාවක්වත් නැහැ.**

**සීල, සමාධි, ප්‍රඥා** වශයෙන් **අනුපිළිවෙලින් ගොනු වූ** මේ අසිරිමත් දහම **අර්ථ සහිතව වදාරන ලද්දක්**. ඒ වගේ ම පැහැදිලි අර්ථ වලින්, **පැහැදිලි වචන වලින්** යුක්ත යි. කාටවත් නො තේරෙන ප්‍රහේලිකා මේ ධර්මය තුළ නැහැ. ක්‍රමයෙන් ගැඹුරට යන අයුරින් **අතිශයින් ම පරිපූර්ණ වූ පාරිශුද්ධ වූ නිකෙලෙස් ජීවිතයකට මග පෙන්වන ස්වභාවයෙන් යුක්ත යි.**

මේ අයුරින් අප ගේ ශාස්තෘන් වහන්සේ මනා කොට වදාළ මේ ධර්මයට **අමුතුවෙන් දේවල් එකතු කළ යුත්තේ නැහැ**. මෙවන් වූ මනා කොට දෙසන ලද ශ්‍රී සද්ධර්මය **ස්වක්ඛාත ගුණයෙන් යුක්ත යි.**

## ආශ්චර්යවත් වූ ශ්‍රී සද්ධර්මයේ සන්දිට්ඨික ගුණය

මේ ධර්මය **මේ ජීවිතයේ දී ම අවබෝධ කළ හැකි එකක්**. මේ තුළ අන්තර්ගත වන්නේ මේ දිවියේ දී ම සාක්ෂාත් කළ යුතු දෙයක් මිස, **මරණයට පත් වූ පසු ලබනා විමුක්තියක් නොවේ**. ඒ නිසා ධර්මයේ හැසිරෙන **කා හටත් එහි සත්‍යය අසත්‍යයතාවය දැකිය හැකියි**. ඒ අයුරින් මනාව ධර්මයේ හැසිරෙන අයට, මේ ජීවිතයේ දී ම **ඒකාන්ත වශයෙන් ප්‍රතිඵල ලැබිය හැකියි.**

එනම් මේ ජීවිතයේ දී ම සද්ධානුසාරී, ධම්මානුසාරී ආදී වශයෙන් සෝවාන් මාර්ගයටත්, සෝතාපන්න ඵලයටත් පැමිණිය හැකි යි. බුදු සමිඳුන් ගේ ශ්‍රාවකයන්ට අවශ්‍ය නම්, සකදාගාමී මාර්ගයටත් - ඵලයටත්, අනාගාමී මාර්ගයටත් - ඵලයටත්, අරහත් මාර්ගයටත් - ඵලයටත් **මේ ජීවිතයේ දී ම පැමිණිය හැකියි.** දැන් ඔබට පැහැදිලි ඇති, **අමා මහ නිවන අත්විඳින්නට තිබෙන්නේ මරණින් මත්තේ නො වන බව.** මේ ජීවිතය තුළ දී ම යි ඒ පරම සැනසීම අත්විඳිය යුත්තේ. එනම්, මේ ධර්මය තුළ තිබෙන්නේ **ඉතාමත් ප්‍රායෝගික වැඩපිළිවෙලක්.**

ලෝකයේ බොහෝ අන්‍ය වූ ධර්මයන් තුළ තිබෙනා අවසන් ඵලය දැකිය හැක්කේ මරණින් පසුව යි. නමුත්, මේ ශ්‍රී සද්ධර්මයේ

ප්‍රතිඵල මේ දිවිය තුළ දී ම අත්විඳිය හැකියි. **ඒ නිසයි මේ ශ්‍රී සද්ධර්මය සන්දිට්ඨික වන්නේ**.

## ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ අකාලික ගුණය

ලෝකයේ පවතින බොහෝ දේ කාලයකට අයිති යි. බටහිර විද්‍යාව තුළ අද සොයා ගන්නා දෙය, හෙට සොයාගන්නා අලුත් දෙයක් තුළින් ප්‍රතික්ෂේප වී යනවා. එනම්, බටහිර විද්‍යාව ආදී බොහෝ **අන්‍ය ධර්මයන් කාලික ස්වභාවයෙන් යුක්තයි**. එනම්, කාලයකට අයිති යි. නමුත් බුදු සමිඳුන් වදාළ මේ **ශ්‍රී සද්ධර්මය කාලයේ පහර කෑමට කිසිසේත් ම හසුවන්නේ නැහැ**.

එයට හේතුව, ඒ ශ්‍රී සද්ධර්මය තුළ - අකාලික - **සියලු කාලයට ගැලපෙන සත්‍යයක් අඩංගු වීම** යි. බුදු සමිඳුන් පිරිනිවන් පා වසර 2550 ක් ගත වී ඇතත්, **කාරණා සහිත ව මේ ශ්‍රී සද්ධර්මය අදට නො ගැලපෙන බව පවසන්නට හැකි අයෙක් තවමත් බිහි වී නැහැ**. එය කිසිදා සිදු නො වන්නක්. ඇස, කණ, නාසය, දිව, කය හා මනස යන ජීවිතය නම් වූ ලෝකයේ යථා ස්වභාවය නො වළහා පවසන මෙම අපූරු ධර්මය, ඇස තිබෙනා තුරු, කණ තිබෙනා තුරු, නාසය - දිව - කය හා මනස නම් වූ **මේ ජීවිතය තිබෙනා තුරු සජීවී ව අත්දැකිය හැකි යි**.

මොහොතක් සිතා බලන්න. බුදු සමිඳුන් ගේ යුගයේ දී මේ ධර්මය ශ්‍රවණය කොට මග ඵල ලාභීන් බිහි වූ බව ඔබ දන්නවා. මේ කාලික ධර්මයක් නම්, අද මේ ධර්මය අවබෝධ කොට මග ඵල ලැබිය නො හැකි විය යුතු යි. නමුත්, **අදටත් මේ ධර්මයට අනුව දිවිය ගත කරනා පින්බර මිනිසුන්ට මේ ධර්මය අවබෝධ කොට සංසාර දුකින් නිදහස් විය හැකි යි.** එවන් වූ සුන්දර මිනිසුන් අදටත් අප ට දැකගත හැකි යි. අනාගතයේත් එසේ ම යි. එනම්, මේ දහම කාලයකට අයිති නොවන්නක් බව පැහැදිලියි නේ ද? ඒ නිසා, මේ දිවියේ දී ම **අකාලික වූ ශ්‍රී සද්ධර්මයේ අකාලික බව අත්විඳින්නට අදිටන් කර ගනිමු**.

## ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ ඒහිපස්සික ගුණය

ලෝකයේ පවතින අන්‍ය වූ ධර්මයන් තුළ ශ්‍රාවකයින් ගේ නුවණින් විමසීමේ හැකියාව අහුරා හුදෙක් ගුප්ත ඇදහීමේ රටාවක් තුළ කොටු කොට තිබෙනු දැකිය හැකි යි. නමුත්, බුදු සම්ඳුන් ගේ **ශ්‍රී සද්ධර්මය ඕනෑම අයෙකුට 'ඇවිත් බලන්න' යැයි කියා දක්වා ලිය හැකි යි**. එනම්, මේ ශ්‍රී සද්ධර්මය විවෘත එකකි.

ඒ තුළ සැඟවුණු ගුප්ත දේ නොමැත. රහස් බණ, සැඟවී කථා බස් කිරීම් නැත. පැමිණ මේ පිළිබඳ ව විමසනා ඕනෑම අයෙකුට, 'ඇවිත් බලන්න' යැයි කියා **අහසේ බබළන හිරු මඬල පෙන්වන්නා සේ, සඳ මඬල පෙන්වන්නා සේ විවෘත ව දක්වා ලිය හැකි යි.** මේ ධර්මය අවබෝධ වන්නේ හුදු ඇදහීමක් තුළින් නොව, **ඇදහීම ඉක්මවා ගිය නුවණින් විමසීම** තුළිනි.

බුදු සම්ඳුන් වදාළේ, අන්‍ය බොහෝ ධර්මයන් සැඟ වී තිබෙනා තුරු (නුවණින් විමසීම අහුරා තිබෙනා තුරු) බැබලුනත්, මේ **ශ්‍රී සද්ධර්මය විවෘත වූ විට ම බබලන බව** යි. මොහොතක් සිතා බලන්න. ඔබ සරණ ගිය ශ්‍රී සද්ධර්මය සඳ මඬල සේ ය. හිරු මඬල සේ ය. විවෘත වූ විට ම බබලයි. පැමිණ බලන්න යැයි ඕනෑම අයෙකුට පවසා පැහැදිලි ව දක්වා ලිය හැකි යි. ඒ නිසා, **ඒහිපස්සික වූ මේ ශ්‍රී සද්ධර්මය 'පැමිණ බලන්න ට' මේ සුදුසු කාලය යි**.

## ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ ඕපනයික ගුණය

අද ලෝකයේ පවතින බොහෝ දැනුම් පද්ධති වනාහී කිසි වැදගම්මකට නැති බාහිර දේ ඔස්සේ ගමන් කරනා ඒවා යි. නමුත්, මේ ධර්මය එයට වෙනස් ය. එනම්, **තමන් තුළට පමුණුවා ගත යුත්තකි**. එනම්, **මෙය දැකිය යුත්තේ තමා තුලිනි**.

සීලය තමා තුළට පමුණුවා ගත යුත්තකි. සමාධිය ද **අත්දැකිය යුත්තේ තමා ම ය**. ජීවිතය පිළිබඳ වූ නිරවුල් අවබෝධය (ප්‍රඥාව) උපදවා ගත යුත්තේ ද තමා ම ය. එනම්, මෙය බාහිර ව පර්යේෂණාගාර තුළ සිදුවන ආකාරයේ බාහිර දේ පිළිබඳ ව

කෙරෙනා හිස් හෙළිදරව්වක් නොවේ. මේ ධර්මය තමා ගේ මෙලොවටත්, පරලොවටත් බලපාන්නා වූ, තමා තුළට ම පමුණුවා ගත යුතු වූවකි. මනා කොට ශ්‍රවණය කිරීමෙන්, මනා කොට ධාරණය කර ගැනීමෙන්, වචනයෙන් පුහුණු කිරීමෙන්, නුවණින් මෙනෙහි කිරීමෙන් හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ යෙදීමෙන් ය මේ ශ්‍රී සද්ධර්මය තමා තුළට පමුණුවා ගත යුත්තේ.

තමා තුළට පමුණුවා ගත් ධර්මයකින් පමණි, තමාට ප්‍රතිලාභ ලැබිය හැක්කේ. **තමන් මේ දහම් මගෙහි ගමන් කළ හොත් මග ඵල ලබන්නේ තමන් ය.** එනම්, මේ දහම කිසිසේත් ම කෙසෙල් ගස් මෙන් වඳ බසිනා දෙයක් නොවේ. එනිසා, වහ වහා මේ **ඕපනයික වූ ධර්මය අප ගේ දිවිය තුළට පමුණුවා ගැනීමට උත්සාහ කරමු**.

## ආශ්චර්යවත් ශ්‍රී සද්ධර්මයේ පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි ගුණය

මේ ධර්මය සඳහා පවුරු පදනම් නැත. වයස් භේද නොමැත. **ඕනෑම ජාතියක, ඕනෑම කුලයක, ඕනෑම ගෝත්‍රයක සිටිනා බුද්ධිමත් මිනිසුනට මෙය අවබෝධ කරගත හැකිය.** කපටි නැති, මායා නැති, වංචා නැති, අවංක ගති ඇති, ඕනෑම අයෙකුට මේ දහම තුළ ප්‍රතිඵල ලැබිය හැකිය. **නමුත්, තම තමන්ගේ නැණ පරිදි ය, මෙය අවබෝධ වන්නේ.** එක් අයෙකුට අවබෝධ වූ පරිදි ඒ අයුරින් ම අන් අයට අවබෝධ වන්නේ නැත. එය වෙන් වෙන් වශයෙන්, තම තමන් ගේ **අභ්‍යන්තරික කුසලතා** (යෝනිසෝ මනසිකාරය, ඉන්ද්‍රිය ධර්ම ආදිය) වැඩී තිබෙනා ආකාරයට අවබෝධ වන්නකි.

එනිසා ම, අභ්‍යන්තරික කුසලතා ඇති **කාහටත් මේ සුන්දර දහමට පිවිසීමට හැකිය.** එනිසා ම, මේ අසිරිමත් දහම **තම තමන් ගේ නැණ පමණින් අවබෝධ කර ගැනීමට වීර්යය කරමු**.

මෙවන් අසිරිමත් ගුණ සයකින් පරිපූර්ණ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ වදාළ **ශ්‍රී සද්ධර්මය අපි මුළු හදවතින් ම සරණ යමු.**

**ඒ අසිරිමත් ශ්‍රී සද්ධර්මයට අප ගේ නමස්කාරය වේවා!**

# ආර්ය මහා සංඝරත්නයේ අසිරිමත් සඟ ගුණ

**බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයන් ද, අසිරිමත් ගුණ සමුදායකින් යුක්ත ය.** එදා බරණැස ඉසිපතන මිගදායේ දී, මේ දහම අවබෝධ කළ කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ගෙන් පැවත එන උතුම් වූ ශ්‍රාවකයන් වහන්සේලා, **ලොව අන් පිරිස් කිසිවකවත් දැකිය නොහැකි අන්දමේ** ගුණ රැසකින් යුක්ත ය. ඒ උතුම් රහතන් වහන්සේලා පල කළ උදානයන් (ථේර ථේරී ගාථා) විමසා බලන විට, **ඒ නිකෙලෙස් හදවත් තුළ මෝදු වී තිබුණු අප්‍රමාණ වූ ගුණස්කන්ධය** පිළිබඳ ව යම් වටහා ගැනීමක් ලබා ගත හැකිය. අප ගේ ශාස්තෘන් වහන්සේ එම **අසිරිමත් සඟ ගුණ** අපට පෙන්වා වදාළ සේක.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ සුපටිපන්න ගුණය

බුදු සමිඳුන් ගේ ශ්‍රාවක සඟරුවන **රාග, ද්වේෂ, මෝහ දුරු කර ගැනීමට වෙහෙසෙන** පිරිසකි. ලෝකයේ සිටිනා බොහෝ පිරිස් උත්සාහ කරන්නේ තමන් තුළ පවතින රාග, ද්වේෂ, මෝහ ආදී කෙලෙස් අවුස්සා ගන්නා අතරේ අනිත් අයව ද එයට පොළඹවා ගැනීමට ය. නමුත් බුදු සමිඳුන් ගේ ශ්‍රාවක පිරිස එසේ නොවේ.

**රාග, ද්වේෂ, මෝහ නම් වූ ලාමක අකුසල් මුලිනුපුටා දමන**, සීල, සමාධි, ප්‍රඥා නම් වූ ත්‍රිවිධ ශික්ෂාවෙහි **හික්මෙන වැඩපිළිවෙලකට මනාකොට පිළිපන් පිරිසක් නිසා**, ආර්ය මහා සංඝරත්නය **සුපටිපන්න** වේ.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ උජුපටිපන්න ගුණය

**මේ පින්බර ශ්‍රාවකයන් වහන්සේලා සෘජු මාවතක ගමන් ගන්නා**

**සේක.** මේ ලෝකයේ තිබෙන්නේ එක ම සෘජු මාවතකි. එනම්, මේ **ආර්ය අෂ්ඨාංගික මාර්ගය** යි. එය තුළ කයෙන් සිදුවන වැරදි නිවැරදි වන නිසා එය සෘජු ය. වදනින් සිදුවන වැරදි නිවැරදි වන නිසා ද එය සෘජු ය. මනසින් සිදුවන වැරදි නිවැරදි වන නිසා ද එය සෘජු ය.

මෙවන් වූ **ත්‍රිවිධ සුචරිතයෙන් යුත්, සුන්දර වූ සෘජු මාවතක ගමන් ගන්නා ශ්‍රාවක සඟ රුවන උජුපටිපන්න වේ**.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ ඤායපටිපන්න ගුණය

බුදු සමිඳුන් වදාළ මග ගමන් කරනා ශ්‍රාවකයන් වහන්සේලා **චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීමට වෙහෙසෙන පිරිසකි**. තමා තුළ නොමැති **ඤාණදර්ශනයන්** උපදවා ගැනීමට වෙහෙසෙන පිරිසකි. ඒ නිසා ම දිනෙන් දින ම මේ **ලෝකය පිළිබඳ ව පවතින අවබෝධ ඤාණය වැඩි කර ගන්නා පිරිසකි.** ඒ සඳහා ම පිළිපන් හෙයින් **ශ්‍රාවක සඟරුවන ඤාණපටිපන්න වන්නේ ය**.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ සාමීචිපටිපන්න ගුණය

ඒ බුදු සමිඳුන් වදාළ **ශ්‍රී සද්ධර්මය ලොව තුළ පතුරවා හරින්නේ** මහ සඟරුවන විසිනි. **මහා ධර්ම ගෞරවයකින් යුතුව බුදු සමිඳුන් වදාළ දෙය ම පවසමින්, අර්ථ විකෘති කිරීමකින් තොරව අවබෝධය පිණිස ම** ඒ දෙය කරන්නේ ය. නොයෙක් මිත්‍යා දෘෂ්ඨි පවසන පිරිස අතර **පිරිසිදු වූ දහම් මග ම පවසන නිසා** ශ්‍රාවක සඟරුවන **සාමීචිපටිපන්න** වන්නේ ය.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ ආහුණෙය්‍ය ගුණය

නිකෙලෙස් සිතක අසිරිය අත්විඳිනා **ශ්‍රාවක සඟරුවන දුර සිට ගෙනෙනා දානය පිළිගැනීමට සුදුසු වන්නේ ය.** බොහෝ දෙනා විවිධාකාරයෙන් විවිධ අයට දන් දුන්නත්, **විශේෂයෙන් සකස් කොට**

දුර සිටිනා පිරිසකට දන් දෙන්නේ කලාතුරකිනි. නමුත්, බුදු සමිඳුන් ගේ ශ්‍රාවක සඟරුවනට, දුර සිට ගෙනෙනා විශේෂයෙන් සකස් කළ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස ආදී සිව්පසයෙන් අඩුවක් නැත. මහත් වූ පුණ්‍යලක්ෂණයන්ගෙන් හෙබි ඒ අසිරිමත් ශ්‍රාවකයන් වහන්සේලා **දුර සිට ගෙනෙනා පුද පූජා පිළිගැනීමට සුදුසු නිසා ආහුණෙය්‍ය නම් වේ**.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ පාහුණෙය්‍ය ගුණය

අප ගේ නිවෙස් වලට හදිසියේ ම ආගන්තුකයෝ පැමිණෙති. නමුත්, අප ඒ අයට සලකන්නේ විවිධාකාරයෙනි. බුදු සමිඳුන් ගේ ශ්‍රාවකයන් වූ, **මග ඵල ලාභී මහ සඟරුවන ආගන්තුකයන් වශයෙන් වැඩම කල කල්හි පවා, සිවුපසයෙන් උපස්ථාන කිරීම සුදුසු ය.** ගරු සත්කාර කිරීමට සුදුසු ය. ඒ නිසා ම මහ සඟරුවන **පාහුණෙය්‍ය** වන්නේ ය.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ දක්ඛිණෙය්‍ය ගුණය

මෙලොව පරලොව සැප විඳීමට කැමති කෙනා පින් කර ගත යුතු ය. පින වනාහී **සැපය හඳුන්වන තවත් වදනක්** ලෙසයි බුදු සමිඳුන් වදාළේ. එනිසා ම, පින් කැමති අය පින් සලකා ගෙන විවිධාකාර දේ කරති. බොහෝ දෙනෙක් පින් සලකා දන් දෙති. මෙසේ **මෙලොව පරලොව යහපත ළඟා කරගැනීම පිණිස, පින් සලකා දෙන දානය පිළිගැනීමට සුදුසු වන්නේ, බුදු සමිඳුන් ගේ ශ්‍රාවක සංඝරත්නය යි**.

කෙලෙස් සහිත උදවිය ඒ කෙලෙස් නිසා ම ප්‍රමාණයන් ගෙන් යුක්ත වන්නෝ ය. කෙලෙස් ප්‍රහාණය කරනා ශ්‍රාවක සඟරුවන කෙලෙස් ප්‍රහාණය කරනා නිසා **අප්‍රමාණ** - ප්‍රමාණ කළ නො හැකි - වෙති. පින් සලකා දන් දෙන විට කෙලෙස් සහිත අයෙකුට දෙන දානයට වඩා, **කෙලෙස් රහිත මුනිවරයෙකුට දෙන දානය මහත්ඵල මහානිසංශ වේ**. බුදු සමිඳුන් ගේ ශ්‍රාවකයන් වහන්සේලා නිරතුරුව ම කෙලෙස් ප්‍රහාණය වන වැඩ පිළිවෙලක හික්මෙන නිසා උන්වහන්සේලා ඒ සඳහා ඉතාමත් සුදුසු ය. එනිසා ය ශ්‍රාවක සඟරුවන **දක්ඛිණෙය්‍ය** වන්නේ.

## භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ අඤ්ජලිකරණීය ගුණය

ලෝකයේ බොහෝ දෙනා යම් යම් දේවල් වලට, යම් යම් පුද්ගලයන්ට වැඳුම් පිදුම් කරති. ඇතැමෙක් මෙසේ කරන්නේ බිය නිසා ය. එසේත් නැතිනම්, පක්ෂපාතී බව පෙන්වීම පිණිස ය. මෙසේ **වැඳුම් පිදුම් ලබනා අය අතර බුදු සමිඳුන් ගේ ශ්‍රාවක සඟරුවන අග්‍ර වේ**. ශ්‍රාවක සඟරුවනට වැඳුම් පිදුම් කරන්නේ භය නිසා නොවේ. උන්වහන්සේලා අනන්ත වූ ගුණයන්ගෙන් සාමාන්‍ය මිනිසුන් ඉක්මවා වැඩ වසන්නෝ ය. එනිසා ම, ගරු කිරීම පිණිස අප සඟරුවනට නමස්කාර කරන්නෙමු. **මෙසේ නිකෙලෙස් මුනිවරුනට, ඇඳිලි බැඳ වන්දනා කරනා බුද්ධිමත් මිනිසුනට අග්‍ර වූ දෙයකට වන්දනා කරනා නිසා අග්‍ර වූ විපාක ලැබේ.** දස දහසක් ලෝක ධාතුව තුළ වසනා අනන්ත වූ දෙව් බඹ පිරිස ද, මෙවන් වූ අප්‍රමාණ ගුණයන් ගෙන් යුතු වූ ශ්‍රාවක සඟ රුවනට නමස්කාර කරති. එනිසා ම, ඒ අසිරිමත් ශ්‍රාවකයන් වහන්සේලා **අඤ්ජලිකරණීය** වන්නේ ය.

## ග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයේ අනුත් පුඤ්ඤක්ඛෙත්ත ගුණය

කෙත යනු කුඹුර යි. ගොවියා කුඹුරෙහි වපුරන්නේ මහත් වූ අස්වැන්නක් අපේක්ෂා කරගෙන ය. එසේ ම, **ලොවේ දෙව් මිනිසුනට පින් අස්වනු නෙලා ගැනීමට තිබෙන්නා වූ අනුත්තර පින් කෙත නම් බුදු සමිඳුන් ගේ ශ්‍රාවක සඟපිරිසයි.** ඒ අසිරිමත් ශ්‍රාවකයන් වහන්සේලා උදෙසා **සුළු දෙයක් පරිත්‍යාග කළ ද, අග්‍ර වූ විපාක ලැබේ.** මේ බුදු සමිඳුන් ගේ ශ්‍රාවකයන් වහන්සේලා තුළ පවතින **අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත ගුණය** යි.

බුදු සමිඳුන් ගේ ශ්‍රාවක පිරිස **ලැබූ මග ඵල අනුව පුද්ගලයන් වශයෙන් අට දෙනෙක් ද, යුගල වශයෙන් ගත් කළ යුගල සතරක් ද වේ.** අවබෝධයෙන් ම බුදු සමිඳුන් සරණ ගිය ඒ සුන්දර ජීවිත ගෙවනා **මග ඵල ලාභී ශ්‍රාවක සඟරුවන මුළු හදවතින් ම සරණ යමු.**

**භාග්‍යවතුන් වහන්සේගේ අසිරිමත් ශ්‍රාවක සඟරුවනට නමස්කාර වේවා!**

# සාදු! සාදු! තෙරුවන් නමඳින්ටයි

01. සාදු! සාදු! බුදු රුවන — වඳින්ටයි
සාදු! සාදු! සදහම් — නමඳින්ටයි
සාදු! සාදු! සඟ රුවන — වඳින්ටයි
සාදු! සාදු! තෙරුවන් — නමඳින්ටයි

02. ගෞතම මුනිඳුගෙ සරණ — ලැබෙන්ටයි
සම්බුදු බණ පද මට සිහි — වෙන්ටයි
ලොව්තුරු සඟ ගුණ සිහි — කරගන්ටයි
ගෞතම සසුනේ පිහිට — ලබන්ටයි

03. වඳිමි වඳිමි බුදු සමිඳුන් — වඳිමි
වඳිමි වඳිමි සිරි සදහම් — වඳිමි
වඳිමි වඳිමි සඟ රුවන ද — වඳිමි
වඳිමි වඳිමි මම තෙරුවන් — වඳිමි

# සාදු! සාදු! මම ගෞතම මුනිඳු සරණ යන්නේ

01. රාග ද්වේෂ මෝහ නො මැති - සිතකින් යුතු වන්නේ
සිල් සමාධි ගුණ නුවණැති - නිවන් සුවය දන්නේ
තුන් ලොව වැඳුමන් ලැබුමට - නිතියෙන් හිමි වන්නේ
අරහං යන ගුණයෙන් යුතු - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

02. ගුරු උපදෙස් කිසිවක් නැති - සෘජු ගමනකි යන්නේ
පෙරුම් පුරා ගෙන ආ බල - රැකවරණෙට එන්නේ
දස බල බුදු නුවණ ඇතිව - තුන් ලොව ජය ගන්නේ

සම්මා සම්බුදු ගුණ යුතු - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

03. කෙලෙසුන් තොර නුවණ ඇතිව - පෙර භවයන් දන්නේ
ඉපදෙන මැරෙනා සසරේ - ඇති තතු වැටහෙන්නේ
හිරු සඳු ලෙස නුවණ ඇතිව - දහමේ හැසිරෙන්නේ
විජ්ජාචරණින් යුතු වූ - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

04. සුන්දර වූ නිවන් මඟෙහි - සොඳින් වැඩමවන්නේ
අමා නිවන් සුවය විඳින - සිතකින් යුතු වන්නේ
සිත කය වචනය හැම විට - සොඳුරුව පවතින්නේ
සුගත ගුණෙන් යුතු ගෞතම - මුනිඳුන් නමදින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

05. දෙව්ලොව බඹ ලොව මනු ලොව - සතර අපා දන්නේ
කල කම් පල දෙමින් සතුන් - ඒ ඒ තැන යන්නේ
ලොව උපදින ලොවින් මිදෙන - මඟ මැනවින් දන්නේ
ලෝක විදූ ගුණයෙන් යුතු - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

06. මහා කාරුණික ගුණ ඇති - බුදු නෙත යොමු වෙන්නේ
දෙසනා විට සිරි සදහම් - ලොව දමනය වන්නේ
සසරේ සැරි සරන සතුන් - එයින් එතෙර වන්නේ
අනුත්තරෝ පුරිසදම්ම - සාරථී නම් වන්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

07. දෙව්ලොව බඹ ලොව දෙවිවරු - බණ ඇසුමට එන්නේ
මනු ලොව නුවණැති මිනිසුන් - නිවන් මඟෙහි යන්නේ
දෙවි මිනිසුන්ගේ උත්තම - ගුරු දෙවිඳුන් වන්නේ
සත්ථා දේවමනුස්සානං - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

08. ලෝ සත විඳිනා දුක ගැන - පැහැදිලි කරමින්නේ
දුකෙන් මිදෙන නිවන් ලබන - මඟ ගැන පවසන්නේ
චතුරාර්ය සත්‍යය ගැන - අවබෝධය දෙන්නේ
බුද්ධ ගුණෙන් යුතු සම්බුදු - සමිඳුන් නමදින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

09. අප මුනිඳුගෙ බුදු නුවණට - හිරු සඳු පරදින්නේ
සීල සමාහිත ගුණයට - ලොව ම වසඟ වන්නේ
දියෙන් උඩට විත් විහිදුන - පියුමක් විලසින්නේ
භගවා යන ගුණයෙන් යුතු - බුදු හිමි නමඳින්නේ
සාදු! සාදු! මම ගෞතම - මුනිඳු සරණ යන්නේ

# සාදු! සාදු! මම ගෞතම
# බුදු බණ නමඳින්නේ

01. මුල මැද අග පිරිසිදු ලෙස - අරුතින් සරු වන්නේ
අවබෝධය ඇති කරවන - වචන හසුරුවන්නේ
මහා කාරුණික නුවණින් - සදහම් දෙසමින්නේ
අප මුනිඳුන් වදහළ බණ - ස්වාක්ඛාත වන්නේ
සාදු! සාදු! මම ගෞතම - බුදු බණ නමදින්නේ

02. පරලොව නොව මෙලොව දී ම - දැක ගත හැකි වන්නේ
අකුසල් දුරු කොට සිල් ගුණ - මතු කළ යුතු වන්නේ
කළණ මිතුරු ඇසුර ඇතිව - සදහම් අසමින්නේ
සන්දිට්ඨික වූ බුදු බණ - දැන ගත යුතු වන්නේ
සාදු! සාදු! මම ගෞතම - බුදු බණ නමඳින්නේ

03. කල් නො යවා පිහිට ලැබෙන - ගුණයෙන් යුතු වන්නේ
මල් වරුසාවක් විලසට - ලොවට සතුට දෙන්නේ
සිල් සමාධි නුවණ වඩන - නිවනට යොමු වන්නේ
අකාලිකයි සම්බුදු බණ - සිත පහදා ගන්නේ
සාදු! සාදු! මම ගෞතම - බුදු බණ නමඳින්නේ

04. රහසේ උපදෙස් පවසන - දෙයින් බැහැර වන්නේ
කාටත් පෙන්වා දිය හැකි - හිරු සඳු විලසින්නේ
ඒ සදහම් මතු වුන විට - මැනවින් දිලිසෙන්නේ
ඒහිපස්සිකයි බුදු බණ - සිත පහදා ගන්නේ
සාදු! සාදු!මම ගෞතම - බුදු බණ නමදින්නේ

05. බණ අසමින් සිත පහදා - එය පිළිපදිමින්නේ
දහමට විනයට අනුවම - හැසිරිය යුතු වන්නේ
තමා තුළ ම ඇති කරගෙන - සදහම් දකිමින්නේ
ඕපනයික වූ බුදු බණ - දැන ගත යුතු වන්නේ
සාදු! සාදු! මම ගෞතම - බුදු බණ නමඳින්නේ

06. නුවණැති අය බුදු බණ ගැන - සිත පහදා ගන්නේ
නුවණින් යුතුවම දහමේ - සතුටින් හැසිරෙන්නේ
තම තම නැණ පමණින් ඒ - සදහම් දකිමින්නේ
පච්චත්තං වේදිතබ්බ - විඤ්ඤූ බව දන්නේ
සාදු! සාදු! මම ගෞතම - බුදු බණ නමදින්නේ

## සාදු! සාදු! මම ගෞතම ශ්‍රාවක නමඳින්නේ

01. රාග ද්වේෂ මෝහ නසන - දහම් ඉගෙන ගන්නේ
දහමට විනයට අනුව ම - බඹ සර සුරකින්නේ
බුදු සසුනට ඇතුළු වෙලා - සිවුරු දරා ගන්නේ
ඒ ශ්‍රාවක සඟ රුවන ද - සුපටිපන්න වන්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

02. අන්ත දෙකම බැහැර කෙරුව - නිවන් මඟෙහි යන්නේ
සිල් සමාධි නුවණ සපිරි - අටඟින් යුතු වන්නේ
සසරින් එතෙරට ගෙන යන - සෘජු මඟ වඩිමින්නේ
උජුපටිපන්නයි සඟ ගණ - සිත පහදා ගන්නේ
සාදු! සාදු!මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

03. අවිදු අඳුරු දුරු කරවන - විදසුන් වඩමින්නේ
චතුරාර්ය සත්‍යය වෙත - සිත යොමු කරමින්නේ
අවබෝධය සලසාලන -නිවන් මඟෙහි යන්නේ
ඤායපටිපන්නයි සඟ ගණ - නුවණින් බබළන්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

04. විහිළු තහළු ඕපදූප - බණකට නො කියන්නේ
ජීවිතයේ ඇති තතු ගැන - නිසි ලෙස පහදන්නේ
උතුම් නිවන් මඟ මතු වන - බුදු බණ දෙසමින්නේ
සාමීචිපටිපන්නයි සඟ ගණ - කළණ මිතුරු වන්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

05. මගඵල පියවර සතරකි - යුගල විලස ගන්නේ
වෙන් වෙන් වශයෙන් ගත් විට - අට දෙනෙක් ම වන්නේ
චතුරාර්ය සත්‍යය දුටු - ඒ ශ්‍රාවකයන්නේ
සරු පිළිවෙත නිසා ලොවේ - සසුනයි බබළන්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

06. දුර ගොස් දන් පිදිය යුතුය - ආහුණෙය්‍ය වන්නේ
ආගන්තුක දන් සුදුසු ය - පාහුණෙය්‍ය වන්නේ
පින් සලකා දීම හොඳ ය - දක්ඛිණෙය්‍ය වන්නේ
අංජලිකරණී ගුණයට - ගරු කළ යුතු වන්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

07. සිහිනුවණින් යුතුව සොඳින් - සිල් පද සුරකින්නේ
සසරේ උපදින දුක වෙත - යන්නට බිය වන්නේ
අට ලෝ දහමට නොසැලෙන - දහම කරා යන්නේ
ලොවට උතුම් පින්කෙත වූ - සඟ ගණ නමදින්නේ
සාදු! සාදු! මම ගෞතම - ශ්‍රාවක නමඳින්නේ

**සාදු! සාදු!! සාදු!!!**

# මහමෙව්නාව භාවනා අසපු සංචිතය

- වඩුවාව, යටිගල්ඔලුව, පොල්ගහවෙල. දුර/ෆැක්ස් : 037 2244602
- පිට්ටුගල, මාලඹේ. දුර : 060 2141428
- කුණ්ඩසාලේ, මහනුවර. දුර : 081 2423488
- කුඹල්වෙල, බණ්ඩාරවෙල. දුර : 060 2570333
- පැරකුම් උයන, පොළොන්නරුව. දුර : 027 2226260
- ආණමඩුව. දුර : 060 2322035
- හොරණ. දුර : 034 2262103
- රාජසිංහ මාවත, හේවාගම, කඩුවෙල. දුර : 011 2537337
- ලෝලුගස්වැව, අනුරාධපුරය. දුර : 060 2259018
- උයන්දන, කුරුණෑගල. දුර : 037 2236465
- අල්ගම, පොතුහැර. දුර : 037 2239230
- උඩැල්ලපොල, බලංගොඩ. දුර : 045 5672760
- සුරවිරුගම, සූරියවැව. දුර : 047 4920660
- බඩල්ගම පාර, හුණුමුල්ල. දුර : 031 2247181
- ගල්නෑව. දුර : 060 2858080
- බණ්ඩාරනායක පෞද්ගලික රෝහල පාර, නිට්ටඹුව. දුර : 0602337887
- තඹකන්ද, සඳලංකාව. දුර : 031 5671415
- සේරුපිට ජනපදය, බොලොස්සගම. කළුතර දකුණ. දුර : 034 5673020
- අඩවිකන්ද, එරත්න. දුර : 045 5674614
- මූකලන්යාය, ඉබ්බාගමුව. දුර : 060 2377537
- මොණරාගල. දුර : 060 2556316
- තෙරගිරිගම, කතරගම. දුර : 047 5670833
- බෝතලේගම, බුලත්සිංහල. දුර : 034 5675374
- හලාවත පාර, කොච්චිකඩේ. දුර : 031 2274219
- මහව. දුර : 060 2974785
- රත්තොට. දුර : 060 2975831
- ලියනගම, පොල්පිතිගම.
- තුම්මෝදර, වළස්මුල්ල.
- ගාල්ල.
- ගිලීමලේ, සිරිපාගම, කුරුවිට.
- බුත්තල.
- වැලිමඩ.
- මහමෙව්නාව අනගාරිකා අසපුව, 7 කණුව, සීෆීල්ඩ් වත්ත, මාවතගම. දුර : 037 2243698
- මහමෙව්නාව අනගාරිකා අසපුව, මුතුගල, දඹදෙණිය.
- මහමෙව්නාව භාවනා අසපුව, කැනඩාව.
- මහමෙව්නාව භාවනා අසපුව, ඇමරිකා එක්සත් ජනපදය.

## මහමෙව්නාව භාවනා අසපුව

මඩවල උල්පත, මාතලේ. දුර : 060 2661111

**මාසික භාවනා වැඩසටහන :** සෑම මසකම පළමු සතියේ සෙනසුරාදා උදේ 7.30 සිට සවස 4.00 දක්වා

**යොවුන් භාවනා වැඩසටහන :** සෑම පුන් පොහෝ දිනකම සවස 1.00 - 5.00 දක්වා

**ළමා දහම් හමුව :** සෑම පුන් පොහෝ දිනකම උදේ 8.00 සිට 11.00 දක්වා